# සුරක්ෂිත දේශයක් සෞභාග්‍යමත් රටක්



**චූලන් කුමාර රත්නායක**

සභාපති - ප්‍රධාන විධායක, නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය

රටක සමෘද්ධිය රඳා පවතින්නේ එහි වාසය කරන පුරවැසියන්ගේ දැනුම, හැකියාව සහ කාර්යශූරත්වය මතය. එහෙත් යුගයෙන් යුගය ලෝකය තුළ නිර්මාණය වන අලුත් ප්‍රවණතා, මහා ඉදිරි පිම් සමඟ අප ද ඊට අනුකූලව ගමන් කිරීමට නම් නවෝත්පාදනය පදනම් කරගෙන මානව සම්පත් සංවර්ධනය කළ යුතු වේ. ඒ සඳහා නිරෝගී දැනුමෙන් සවිමත්, ඵලදායි පුරවැසියන් ගොඩනැගීමේ වගකීම අප භාර ගන්නෙමු.

මෙම වගකීම ඉටු කිරීම වෙනුවෙන් නිල භාෂා වෘත්තීය අධ්‍යයන ආයතනය කැප වන්නෙමු.

## නිල භාෂා වෘත්තීය අධ්‍යයන ආයතනය යනු....

Institute of Official Languages and Professional Studies - IOLPS හෙවත් නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය යනු 2007 අංක 7 දරණ සමාගම් පනතෙන් සංස්ථාපිත වූ ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධානතම අධ්‍යාපන ආයතනයකි. මෙම ආයතනය වෘත්තීය අධ්‍යයන ආයතනයක් වශයෙන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇත. එමෙන්ම එම කොමිෂන් සභාව විසින් විශිෂ්ඨයන්ට පිරිනැමෙන තත්ත්ව සහතික සම්මානයෙන් ද Quality Manegment System (QMS) නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය පිදුම් ලබා ඇත. එමෙන්ම ජාතික භාෂා අධ්‍යාපනයේ පුරෝගාමී රාජ්‍ය ආයතනය වන ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය National Institute of Language and Education and Training (NILET) විසින් ක්‍රියාත්මක කරනු ලබන භාෂා පුහුණු පාඨමාලා ප්‍රචලිත කරනු වස් එම ආයතනයේ හවුල්කාර හෙවත් නියෝජිත ආයතනයක් ලෙස ද මෙම ආයතනය වෙත අවබෝධතා ගිවිසුමක් මගින් වගකීම් පවරා තිබේ. ශ්‍රී ලංකාවේ පැරණිතම හා විශිෂ්ඨතම රූපවාහිනී මාධ්‍ය ජාලය වන ස්වාධීන රූපවාහිනි ආයතනය සමඟ ඒකාබද්ධව දැනුම ආකල්ප හා කුසලතා සංවර්ධනය ප්‍රචලිත කරනු වස් ගමට දැනුම නමින් විශේෂ ව්‍යාපෘතියක් නිර්මාණය කරමින් එය මේ වන විට රට තුළ ක්‍රියාත්මක කරමින් පවතී. ඒ වෙනුවෙන් මෑත කාලයේදී ආයතන ප්‍රධානීන් අවබෝධතා ගිවිසුමකට එළැඹෙන ලදී.

නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය නම්‍යශීලී අදහස්වලින් පරිපූර්ණ වූ අධ්‍යාපන ආයතනයක් වූ බැවින් එහි ක්‍රියාදාමය පහත සඳහන් සුවිශේෂී ලක්ෂණවලින් සමන්විත වේ.

- රැකියා සොයන්නන් වෙනුවට තවත් අයෙකුට රැකියා උත්පාදනය කළ හැකි පුරවැසියකු බිහි කිරීම.
- සෑම නිවසකම ඉංග්‍රීසි කතා කරන දරුවෙක් නිර්මාණය කිරීම.
- යුගයෙන් යුගය ලෝකය තුළ නිර්මාණය වන අලුත් ප්‍රවණතාවයනට අනුකූලව ගමන් කිරීමට දැනුමෙන් සවිමත් පළදායී පුරවැසියන් බිහි කිරීම. යන ආදර්ශයන් ඒ අතර වැදගත් වේ.

IOLPS යන වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණෙහි පුරෝගාමී සාමාජිකයෙකි. ජාතික මෙහෙවර සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඇතුලු වෘත්තීය සමිති හා සංගම් සමඟ ඒකාබද්ධව කටයුතු කරන

ආයතනයකි. ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව මහජන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම, කෝවිඩ් වසංගතයෙන් පසු ආර්ථික පුනර්ජීවනය සඳහා ව්‍යාපාරික සංසද සමුළුව පැවැත්වීම, වෘත්තීය ව්‍යවසාකයන්ගේ සංගමය පිහිටුවා එහි සභාපතිත්වය දැරීම. අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාවය මත පාසල් දරුවන්ගේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම වර්ධනය සඳහා දායක වීම එම සමාජ මෙහෙවරෙහි කොටසක් ලෙස දැක්විය හැකි වේ.

නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය විශිෂ්ට ගණයේ උපදේශක මණ්ඩලයකින් සමන්විත වන අතර එම උපදේශක මණ්ඩලය පහත සඳහන් විද්වතුන්ගෙන් සමන්විත වේ.

1. රාජකීය පණ්ඩිත මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි. (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
2. ආචාර්ය සුනිල් ලියනආරච්චි මහතා (හිටපු සභාපති ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාලය හා උපදේශක තාක්ෂණ විශ්වවිද්‍යාලය)
3. ආචාර්ය එස්. ආර්. එම්. එස්. රවිහංස චන්ද්‍රතිලක මහතා (හිටපු කතිකාචාර්ය මොරටුව විශ්වවිද්‍යාලය)
4. කේ. ඒ. තිලකරත්න මහතා (හිටපු රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් හා අමාත්‍යාංශ ලේකම්)
5. ඉන්ජිනේරු පී. එල්. ඒ. ජයසිංහ මහතා (හිටපු විධායක අධ්‍යක්ෂ. ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාලය)
6. ආචාර්ය එස්. ඒ. ආර්. ආර්. පී. දිසානායක මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලය)



## සුභාශිංසනය යි!

රාජකීය පණ්ඩිත පූජ්‍ය **මැදගොඩ අභයතිස්ස හිමි**
මහාචාර්ය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

භාෂාව යනු සන්නිවේදනයේ ප්‍රබලතම මාධ්‍යයි. භාෂාවත් සංස්කෘතියත් අතර ඇත්තේ පුදුමාකාර බැඳියාවකි. සංස්කෘතියේ ප්‍රතිමූර්තිය භාෂාවයි. ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම රටක ජනතාවගේ සංස්කෘතීන් පිළිබඳව අධ්‍යනය කළ හැකි වන්නේ එම රට තුළ මිනිසුන්ගේ ප්‍රබලතම සන්නිවේදන මාධ්‍යය වන භාෂාව පිළිබඳ හැදෑරීමෙනි. භාෂාව හුදෙක්ම මිනිසා විසින් සංස්කෘතිය ඔස්සේ නිර්මාණය කරගත් සංස්කෘතික වෙනස්වීම මත වෙනස් වෙමින් යන නම්‍යශීලී මෙවලමක් ලෙස හැඳින්විය හැකි වේ.

අප බුදු රජාණන් වහන්සේ පස්වග තවුසනට ධර්මය අවබෝධ කරදීමෙන් ඇරඹුණු ධර්ම ප්‍රචාරය ලොවට ගෙන යාමට පාලි භාෂාව ඉවහල් විය. සංස්කෘත, සිංහල, දෙමළ වැනි පෙරදිග භාෂාවන් මෙන්ම ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, ජපන්, චීන වැනි භාෂාවලින්ද යථෝක්ත ධර්ම ප්‍රචාරක කර්තව්‍යයට පිටුවහලක් සැපයුණි. එපමණක් නොව ආර්ථික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික වශයෙන් විවිධ සමාජ සත්කාරයනට දායක වෙමින් ගම් දනවු සැරි සරන අප නිරතුරුවම දකින බලවත් අඩුපාඩුවක් වන්නේ අපගේ දරු දැරියන්ගේ ඉංග්‍රීසි භාෂාව මැනවින් හැසිරවීමේ අපහසුතාවයි. ජාත්‍යන්තරය දිනීමේ කාර්යයටද මෙය බලවත් අභියෝග යක්ව පවතී. ත්‍රි භාෂා අධ්‍යාපනය තම පරමාර්ථය කරගත් නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය විසින් ක්‍රියාත්මක කෙරෙන භාෂා මාධ්‍යස්ථාන පිහිටුවීම හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, මා මුලින් සඳහන් කළ බලවත් අඩුපාඩුව සමනයට ඇති උපාය මාර්ගයක් වේ. මෙම වැඩසටහන ශ්‍රී ලාංකික ජනතාවට නව දොරමඩලාවක් විවෘත කරන තුටු පඬුරක් වනු ඇත.

## ගරු ඇමැතිතුමාගේ පණිවුඩය



**ජනක බණ්ඩාර තෙන්නකෝන්**
රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

නූතන ලෝකයේ අභියෝගවලට මුහුණදීම සඳහා ඉංග්‍රීසි භාෂාව ඉතා හොඳින් හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍ය සාධකය කි. එම හැකියාව සමාජයේ එක් පිරිසකට නොව සියලු දෙනාටම ලැබිය යුතු යැයි මම සිතමි. ඒ සඳහා වඩාත් ආකර්ෂණීය සහ ඵලදායි වූ භාෂා ඉගැන්වීම් සඳහා වන නූතන තාක්ෂණික භාවිතයන්ගෙන් යුතු ක්‍රමවේදයක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම කාර්යය රාජ්‍ය අංශයට පමණක් නොව කළ හැකි ක්‍රියාවක් නොවන අතර පෞද්ගලික අංශයේ සහයෝගය ඒ සඳහා ලැබීම ඉතාමත් වැදගත් සාධකය කි.

අද වන විට අප රටේ රැකියා උත්පාදනය වැඩි වශයෙන් සිදු කළ යුතුව ඇති අතර එමගින් රටේ විරැකියා ගැටළුවට පිළියම් ලැබනු ඇත. ඉංග්‍රීසි භාෂාව ප්‍රචලිත කිරීම මගින් රට තුළ රැකියා අවස්ථාවන් පුළුල් කිරීමට දරන ප්‍රයත්නය ඉතාමත් අගය කොට සලකමි. නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ ද සහාය ඇතිව මෙම වගකීම ජාතික අවශ්‍යතාවක් වශයෙන් හඳුනාගෙන ඉටුකරන බව මම තරයේ විශ්වාස කරමි.

නිර්මාණශීලී ශ්‍රී ලාංකිකයෙකු බිහි කිරීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප මත ගොඩනැගුණු සැලසුම් සහගත අධ්‍යාපන ක්‍රමයක් අපට අවශ්‍යව ඇත. ඒ සඳහා ත්‍රිභාෂා  දැනුම, තොරතුරු තාක්ෂණය, පරිගණක හා සන්නිවේදන ක්‍රියාකාරකම් සහිත ඵලදායී වූ පරිසරයක් නිර්මාණය කිරීම ද අත්‍යවශ්‍ය කරුණකි.

නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය, අනාගත ලෝකයේ අභියෝග ජයගත හැකි ගැමි ප්‍රජාවක් බිහි කිරීමේ උදාර සත් කාරයට පෙරමුණ ගෙන කටයුතු කරමින් සිටී. එහි ඒකායන පරමාර්ථය, අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි ආධ්‍යාත්මික ගුණ නුවණින් හෙබි පරපුරක් බිහිකිරීම යි. මාගේ ඍජු අධීක්ෂණය යටතේ පවතින මාතලේ පරිපාලන දිස්ත්‍රික්කය තුළින් මෙම උදාර වැඩසටහන ආරම්භ කරමින් එය රට පුරා ව්‍යාප්ත කිරීමට දරන උත්සාහයට නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයටත්, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයටත් මගේ ගෞරවය සහ සුභපැතුම මෙයින් එක්කර සිටිමි.



## සුභාශිංසනය යි!

**ජයම්පති බංඩාර හීන්කෙන්ද**

සභාපති, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය
(රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාතංශ්‍ය)

නිර්මාණශීලී ශ්‍රී ලාංකිකයකු බිහි කිරීම සඳහා වන ආකල්පමය වෙනසක්ම් පදනම් කරගත් නිසි සැලැස්මක් සහිත ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් වත්මන් රජය ක්‍රියාත්මක කරමින් පවතී. මෙම ක්‍රියාවලිය තුළ රාජ්‍ය සේවය වඩාත් කාර්යක්ෂම කිරීම සඳහාත් නූතන ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව ඇති කිරීම සඳහාත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් ඉතා හොඳින් හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍ය සාධකයකි. එම හැකියාව සමාජයේ ටික දෙනකුට නොව සියලු දෙනාටම ලැබිය යුතුය. ඒ සඳහා වඩාත් ආකර්ශනීය සහ පළදායි වූ භාෂා ඉගැන්වීම් සඳහා වන නූතන තාක්ෂණික භාවිතයෙන් යුතු ක්‍රමවේදයක් හඳුන්වාදීම වැදගත් වේ. මෙම සත්කාරය හඳුනාගත් ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය මේ වන විටත් අපගේ නියෝජිත භාවය නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයට ලබාදී ඇත. සෑම නිවසකම ත්‍රිභාෂා කථා කරන දරුවෙක් යන තේමාව යටතේ ගම් මට්ටමින් ත්‍රිභාෂාවන් ප්‍රචලිත කිරීමට ගන්නා උත්සාහයට අපද පුරෝගාමී ලෙස සහය ලබාදෙමින් ඊට දායක වන බව සතුටින් ප්‍රකාශ කර සිටිමි.



## සුභාසිංශනය යි!

දේශමාන්‍ය ආචාර්ය **සුනිල් පරාක්‍රම ලියනාරච්චි**
හිටපු සභාපති, ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ
උපදේශක සභාවේ සභාපති නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය

රටක සංවර්ධනයේ වැදගත්ම සාධකයක් ලෙස සන්නිවේදනයේ දියුණුව දැකිය හැකිය. යහපත් සන්නිවේදනයක් ගොඩනගා ගැනීම සඳහා භාෂා දැනුම වැඩි දියුණු කිරීම ඉතාමත් වැදගත් වේ. විශේෂයෙන්ම නගරයේ සිට ඈත පිටිසර ගම් නියම්ගම් දක්වා විදෙස් භාෂා දැනුම ප්‍රචලිත කිරීම රටක් සංවර්ධනය කිරීම සඳහා ඉතාමත් ප්‍රයෝජනවත් වේ. එසේම විවිධ භාෂාවන් හැසිරවිය හැකි දරු පරපුරක්, යෞවන යෞවනියන් රට තුළ බිහි කිරීම මගින් දීර්ඝකාලීන සාමය ඇති කිරීමට ද මහත් රුකුලක් වනු ඇත. නිල භාෂා හා වෘත්තිය අධ්‍යයන ආයතනය මගින් සෑම නිවෙසකම ඉංග්‍රීසි කථාකරන දරුවෙක් බිහිකිරීමේ පරමාර්ථයෙන් ආරම්භ කෙරෙන ත්‍රීභාෂා ඉගෙනුම් මධ්‍යස්ථානය පිහිටුවීම හා ඉංග්‍රීසි ගුරුවරුන් ලෙස පුහුණුවට බඳවාගැනීමේ වැඩසටහන තුළින් විශ්ව දැනුම ගමට රැගෙන යාමට අලුත් මගක් ගොඩනැගෙනු ඇත. එපමණක් නොව එමගින් බිහිවන නව දරු, තරුණ හා වැඩිහිටි පරපුර දෙස බැලූ විට රටක සාමය, සමගිය සහ සංවර්ධනය සඳහා මහත් රුකුලක් වනු ඇතැයි මම විශ්වාස කරමි. එසේම රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ එකතුවීම ද ඉතාමත් කාලෝචිත ක්‍රියාවක් ලෙස මම දකිමි. විශේෂයෙන්ම ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය හා එක්ව සිසුන් සඳහා සහතික පත් ලබාදීම නිසා පාඨමාලාවන් හදාරන සිසුන්ට ලැබෙන සහතිකය ද ඉතා වැදගත් වේ. නිල භාෂා හා වෘත්තිය අධ්‍යයන ආයතනය විසින් ඉටුකරන කාර්යයන් සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.



# සුභාසිංසනය යි!

**කේ.ඒ. තිලකරත්න**

අධ්‍යක්ෂ නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය
(හිටපු රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්)

ආදී වශයෙන් කුඩා කාලයේ දී අප ඉගෙනුම ලැබූ අපගේ ලෝකය විචිත්‍රය, විවිධාකාරය. එමෙන්ම විවිධත්වයෙන් යුක්තය. විවිධ රටවල්, විවිධ ජාතීන්, විවිධ ආගම්, විවිධ සංස්කෘතීන් මෙන්ම විවිධ, විවිධ භාෂා වලින් ද මෙම ලෝකය පරිසමාප්ත වේ. සෑම සංස්කෘතියකම මූලික කැඩපත භාෂාවයි. භාෂාව ඕනෑම ජාතියක අනන්‍යතාවය ලොවට විදහාපාන මෙවලමක් ලෙස ද හැඳින්විය හැකිය. භාෂාව පිළිබඳව විචාර බුද්ධියෙන් යුතුව විමසා බැලීමේදී හුදෙක්ම එය ශබ්ද, පද හා වාක්‍යයන්ගෙන් සමන්විත අසිරිමත් නිර්මාණයකි. සරලව කියතොත් ඔවුනොවුන්ගේ අදහස් හා අවශ්‍යතා දැනගැනීම සඳහා, සංහිඳියාව ඇති කරලීම උදෙසා උපකාරීවන මෙවලම භාෂාව වේ.

ලොව දැනට භාවිතා වන භාෂා සියල්ල ජීව භාෂා හෙවත් ස්වාභාවික භාෂා, මෘත භාෂා, සම්භාව්‍ය භාෂා හා කෘතිම භාෂා වශයෙන් කොටස් හතරකට බෙදා වෙන් කළ හැකිවේ. වර්තමානයේ දී ඉතා වැදගත් වන්නේ මින් ජීව භාෂා හෙවත් ස්වාභාවික භාෂා වේ. ජීව ගුණයෙන් යුතු භාෂා වශයෙන් හඳුන්වන්නේ දැනට භාවිතයේ පවතින සියලු භාෂාවන්ය. උදාහරණ වශයෙන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජපන්, චීන වැනි භාෂා ජීව භාෂාවන් වේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා දෙකක් වේ. සිංහල හා දෙමළ භාෂා එම ද්විත්වය යි. ඉංග්‍රීසි සන්ධාන භාෂාව ලෙස හැඳින්වෙයි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iv වන පරිච්ඡේදයේ 8-25 දක්වා වූ වගන්තිවලින් සිංහල හා දෙමළ භාෂා ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වශයෙන් මෙන්ම ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව වශයෙන්ද පැහැදිලිව දක්වා තිබේ. සිංහල හා දෙමළ භාෂා අතර අනාදිමත් කාලයක් තිස්සේ සිදුවන සංස්කෘතිකමය සංස්පර්ශය නිසා මෙම භාෂා දෙක අතර සමාන උච්චාරණයක් හා අර්ථ සමානාත්මතාවයක් දැකිය හැකි වුවත් භාෂාව නොදැනීම නිසා අප බෙහෙවින් දුරස් වී තිබේ. ඒ නිසාම උතුරුකරයට යන අප ගොළුවන් සේ හැසිරෙන අතර දකුණට පැමිණෙන ඔවුන් ද එසේ ම වෙති. පසුගිය කාලය තුළ අප රට තුළ බොහෝ ජනවාර්ගික ගැටලු නිර්මාණය වූයේද මෙම භාෂාමය ගැටලුව නිසාය. වර්තමානයේ දී මෙම මහා ගැටලුව අප අවබෝධ කරගෙන සිටිමු. රාජ්‍ය සේවයට පිවිසෙන සියලු නිලධාරීන් හට මෙම භාෂා ප්‍රවීණතාවය තිබිය යුතුය. එසේ නොමැතිව සේවා ස්ථිරභාවය ලබාගත නොහැකිය. සන්ධාන භාෂාව වූ ඉංග්‍රීසි, ජාත්‍යන්තර කටයුතු සම්බන්ධීකරණයට පමණක් අද යොදා නොගනී. තමා සතු හොඳම අවිය වර්තමානයේ දී ඉංග්‍රීසි භාෂාව යි. ඉංග්‍රීසී භාෂා ප්‍රවීණතාවය බොහෝ ගැටළු ජය ගැනීමට හොඳම මග බව සිහි තබා ගැනීම ඉතා වැදගත් වේ. ඉංග්‍රීසී භාෂාවෙන් රට පෝෂණය කිරීම සඳහා නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය මගින් ශ්‍රී ලංකාව පුරා ඉංග්‍රීසි භාෂාව ක්‍රමානුකූලව ව්‍යාප්ත කිරීම සඳහා පාසල් දරුවන්, තරුණයන් සහ වැඩිහිටියන් වෙනුවෙන් ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයත් එක්ව සිදුකිරීමට යන ව්‍යාපෘතියට මාගේ උණුසුම් සුභ පැතුම් පිරිනමමි.

---

**ශ්‍රී ලංකාවේ වෘත්තීය අධ්‍යාපනය මෙන්ම භාෂා අධ්‍යාපනයේ පුරෝගාමී ආයතනය වන නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය පහත සඳහන් කාර්යභාරය ශ්‍රී ලංකාවට දායාදකොට තිබේ.**

## 1. ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය ප්‍රචලිත කිරීම

නූතන ලෝකයේ අභියෝගවලට මුහුණදීම සඳහා ඉංග්‍රීසි භාෂාව ඉතා හොඳින් හැසිරවීමේ හැකියාව වර්තමානයේදී අත්‍යාවශ්‍ය සාධකයක් වී තිබේ. එම හැකියාව සමාජයේ ටික දෙනෙකුට නොව සියලුදෙනාටම තිබිය යුතු වේ. අප දන්නා පරිදි සියලුම දරුවන්ට කුඩා කාලයේදී පවා ඉංග්‍රීසි වචන, වාක්‍යය, සරල වාක්‍ය කාණ්ඩ නිරතුරුවම ශ්‍රවණය කිරීමට අවස්ථාව හිමි වේ. ඇතැම්විට දෙමව්පිය අභාෂය හා විද්‍යුත් මාධ්‍ය භාවිතය හේතුවෙන් සිංහල භාෂාව හා තරමටම ඉංග්‍රීසි භාෂාව ද අධ්‍යයනයට අවස්ථාව හිමි වේ. කෙසේ වෙතත් මුලින් සඳහන් කළ පරිදි මෙම හැකියාව සමාජයේ සියලුම සිසු සිසුවියන් හා යෞවන යෞවනියන් හට හිමි නොවීම කණගාටුවට කරුණකි. වසර 13 ක අඛණ්ඩ පාසල් අධ්‍යාපනය අවසානයේදී පවා ඉංග්‍රීසි භාෂාව බොහෝදෙනෙකුට මනාව හැසිරවීමට හැකියාව නොලැබීම ඊට කදිම උදාහරණයක් වේ.

ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේදී එක් එක් අයට විවිධ වූ දුෂ්කරතාවයන් පවතින බව නොරහසකි. එක් පිරිසකට මෙම භාෂාව සාමාන්‍යයෙන් ලිවිය හැකිවන අතර තවත් පිරිසකට කතා කළ හැකි වේ. තවත් අයෙකුට ඇසෙන විට තේරුම් ගත හැකි වන අතර කතා කළ නොහැකි වේ. මේ සඳහා බලපාන මූලික හේතුව වන්නේ භාෂාවක මූලික අවශ්‍යතාවයන් අංග සම්පූර්ණ නොවී යම් යම් කොටස් පමණක් හදාරා තිබීමයි. මෙයට විසඳුමක් ලෙස නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය (Institute of Official Language and Professional Studies - IOLPS) විසින් නිසි ක්‍රමවේදයක් යටතේ ඉංග්‍රීසි භාෂාව මැනවින් හැසිරවීමට එනම් සවන්දීමට, කතා කිරීමට, ලිවීමට හා කියවීමට ප්‍රායෝගිකව ඉගැන්වීමට කටයුතු සලසා ඇත. කන පුහුණු කිරීම මගින් සවන්දීමත්, දිව පුහුණු කිරීම මගින් හොඳින් කතාවත්, ඇස පුහුණු කිරීම මගින් කියවීමත්, අත හුරු කරලීම මගින් ලිවීමත් ඉගැන්වේ. මෙහි සාර්ථකත්වය මනා ලෙස ලබාගැනීම සඳහා මානසිකව සිත ශක්තිමත් කිරීමත් භාෂාවට ඇති බිය දුරු කරලීමත් සඳහා විශේෂ වැඩ පිළිවෙළක් අප ආයතනය සලසා තිබේ. නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ භාෂා විද්‍යාගාරය, භාෂා වැඩමුළු හා භාෂා ශ්‍රවණාගාරයන්ට පැමිණෙන සෑම ඉගෙනුම්ලාභියෙකුටම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා පරිචයක් ලබාදීම අප ආයතනය මගින් තහවුරු කෙරේ.

සෑම නිවසකම ඉංග්‍රීසි භාෂාව මැනවින් කතා කරන දරුවෙකු බිහිකිරීම අප ආයතනයේ ඒකායන පරමාර්ථය යි. ඉංග්‍රීසි දැනුම ක්‍රමවත්ව ලබාදීම තුලින් ශ්‍රී ලාංකික සිසු සිසුවියන්ගේ හා යෞවන යෞවනියන්ගේ අනාගත දිනුම සහතික කෙරෙන පහත සඳහන් ඉංග්‍රීසි පාඨමාලා හා වැඩමුළු සංවිධානය කොට තිබේ.

### Intensive Course for English - ICE දින 30 ක නේවාසික වැඩමුළුව

දේශීය මෙන්ම විදේශීය උපදේශකවරුන්ගේ මග පෙන්වීම යටතේ දියත් කෙරෙන මෙම වැඩමුළුව තෝරාගනු ලබන සීමිත පිරිසක් වෙනුවෙන් පමණක් පැවැත්වෙන නේවාසික වැඩමුළුවකි. ගැහැණු - පිරිමි දෙපාර්ශවය වෙනුවෙන් වෙන වෙනම මෙම වැඩමුළු සංවිධානය කෙරේ. පාඨමාලාව අවසානයේදී සියලුම සහභාගීවන්නන්හට ඉංග්‍රීසි භාෂාව මනාව හැසිරවීමේ පරිචය ලබාදීම සහතික කෙරේ. සම්පූර්ණ වැඩමුළුව තුළ දිනකට පැය 15 බැගින් වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවනු ලැබේ. ආහාර, නවාතැන්, නිල ඇඳුම්, වෛද්‍ය හා වෙනත් පහසුකම් සහිත සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු:60,000 කි. පාඨමාලාව අවසානයේ Certificate in English ප්‍රවීණතා සහතික පත්‍රය ප්‍රදානය කෙරේ. බත්තරමුල්ල හා එප්පාවල වායු සමනය කළ මධ්‍යස්ථානයන්හිදී මෙම භාෂා කඳවුරු පැවැත්වේ.

### Intensive Course for English - ICE සහතිකපත්‍ර පාඨමාලාව

දේශීය මෙන්ම විදේශීය උපදේශකවරුන්ගේ මග පෙන්වීම යටතේ දියත් කෙරෙන මෙම පාඨමාලාව පැය 288 න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලින් යුක්ත වේ. බත්තරමුල්ල නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ (IOLPS) වායු සමනය කළ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන මෙම පාඨමාලාවේ කාලය

මාස 4 කි. සතියේ දිනවල ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා ද එමෙන්ම සති අන්තයේ ද මෙම පාඨමාලාව පැවැත්වේ. කඩිනමින් ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට කැමති සියලුදෙනා හට මෙම පාඨමාලාව පිටුවහලක් වනු ඇත. මෙම පාඨමාලාවෙහි පූර්ණ පාඨමාලා ගාස්තුව රු: 24,000 ක් වන අතර එම ගාස්තුවෙහි පළමු වාරිකය ලෙස රු:12,000 ක් ද දෙවන හා තෙවන වාරික ලෙස රු:6000 බැගින් වූ වාරික දෙකකින් ගෙවීමට පහසුකම් සලසා ඇත. පාඨමාලාව සාර්ථකව නිම කළ විට Certificate in English ප්‍රවීණතා සහතික පත්‍රය ප්‍රදානය කෙරේ.

## Certificate in English and Employability Development - CEED පාඨමාලාව

පාසල් අධ්‍යාපනයෙන් පසුව උසස් අධ්‍යාපනයට හෝ රැකියාවකට යාමට සැලසුම් කරන තරුණ තරුණියන් සඳහා විශේෂයෙන් සැකසූ පාඨමාලාවකි. මාස 06ක සිද්ධාන්ත කාලසීමාවකින් සහ සිව්මාසික ප්‍රායෝගික කාල සීමාවකින් යුතු මෙම පාඨමාලාව හදාරන අයෙකුට මූලික ලෙස තම පළමු රැකියාව ආරම්භ කිරීම්ට අඩිතාලම සකසා ඇත. පාඨමාලාව තුළ ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණය, මෘදු කුසලතා සංවර්ධනය, වැඩබිම් කළමනාකරණය අන්තර්ගත කර ඇත. ශ්‍රී ලංකාව තුළ ඇති ආරම්භක වැඩබිම් සේවකයෙකු බිහිකරන එකම පාඨමාලාව මෙයයි. මෙම පාඨමාලාව තුළින් රැකියාවකට සුදුසුකම ලැබෙනවාසේම උසස් අධ්‍යාපනයේදී මෙම පාඨමාලව තුළ හදාරන පාඩම් ඒකක සඳහා නිදහස් කිරීමක්ද හිමිවේ. පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 55,000කි.

## Foundation to English Language Teaching - FELT පාඨමාලාව

පාසල් අධ්‍යාපනයෙන් පසු සෑම අයෙකුගේම සිහිනය වන්නේ තමන් කුඩා කල සිට සිහින මැවූ උසස් අධ්‍යාපන අවස්ථාව උදාකර ගැනීමත්, ඒ සමඟම රැකියාගත වීමත් වේ. නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය නිරන්තරයෙන්ම කටයුතු කරන්නේ අප ආයතනය තුළ ඉගෙනගනු ලබන සෑම සිසුවෙකුගේම අධ්‍යාපනය මෙන්ම රැකියාවද සුරක්ෂිතවන ලෙස කටයුතු කරමිනි. අභිමානවත් ඉංග්‍රීසි ගුරුවෘත්තියට නිවැරදි ප්‍රවේශයක් ලබාදෙමින් ''ඉංග්‍රීසි ගුරුවෘත්තියට පදනම'' පාඨමාලාව හඳුන්වා දෙන අතර එමගින් වෘත්තියක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සිදු කිරීමට සැලසුම්කරන අය සඳහා හොඳ ආරම්භයක් නියත ලෙසම ලැබේ. එපමණක් නොව මෙම පාඨමාලාව හැදෑරීම මගින් අපගේ Advanced Diploma in English Language Teaching ඉංග්‍රීසි භාෂාව ඉගැනීම පිළිබඳ උස්ස ඩිප්ලෝමා පාඨමාලාව පළමු වාරය සම්පූර්ණයෙන් නිදහස් වීමද සිදුවේ. මාස 06ක අධ්‍යාපන කාලසීමාවකින් හා මාස 06ක ප්‍රායෝගික පුහුණු කාලයකින් මෙම පාඨමාලාව සුසංයෝග වී ඇත. පාඨමාලා ගාස්තුව 87,500කි

## Diploma in English Language Teaching - DELT පාඨමාලාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) අනුමත කළ මෙම පාඨමාලාලාභීන් හට NVQ 5 මට්ටම ඩිප්ලෝමාව හිමිවේ. පාඨමාලා කාලය මාස 18 කි. ඉන් මාස 12 ක් තුළ න්‍යායාත්මක දේශන හා අභ්‍යාසවල නිරත විය යුතු වේ. ඉන් අනතුරුව තවත් මාස 06 ක් ප්‍රායෝගික අභ්‍යාස හා පුහුණුවෙහි නිරත විය යුතුය. NVQ 5 ඩිප්ලෝමාධාරීන්ට වෘත්තීය හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ප්‍රවේශයට මුහුණදී ඇතුළුවීමට වරම් ලැබෙන අතර වසර 02 ක අධ්‍යයන කාලසීමාවෙන් අනතුරුව B.Ed උපාධිය සඳහා ද උසස් අධ්‍යාපනය වෙනුවෙන් යොමු විය හැකි වේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අ.පො.ස. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි භාෂාවට සම්මාන සමාර්ථයක් ද එමෙන්ම අ.පො.ස. උසස් පෙළ ප්‍රධාන විෂයයන් තුන සමත්වීමද අවශ්‍ය වේ. අ.පො.ස උසස් පෙළ අපේක්ෂාවෙන් සිටින සිසුන්ට ද අයදුම් කළහැකි වේ. සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා ගාස්තුව රු: 175,000 කි. එය අදියර කිහිපයකින් ගෙවීමට පහසුකම් සලසා ඇත. පාඨමාලාව සතියේ දිනවල හා සති අන්තයේදී බත්තරමුල්ල නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ (IOLPS) වායු සමනය කළ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ. වෘත්තීය සුදුසුකමක් වන මෙම ඩිප්ලෝමා සහතිකය අනාගත දියුණුවට අත්‍යාවශ්‍ය සාධකයක් වනු ඇත.

## Advanced Diploma in English Language Teaching - ADELT

### ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට විශිෂ්ටයින් බිහිකිරීම උදෙසා නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය (IOLPS) විසින් මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාව මෙහෙයවනු ලැබේ. පූර්ණ සුදුසුකම් ලත් හා මනා පරිචයකින් යුත් ඉංග්‍රීසි භාෂාව ඉගැන්විය හැකි ගුරුවරුන් රටට දායක කිරීම මෙහි ප්‍රමුඛ අරමුණයි. ඉදිරි වසර 02 ක් වැනි කෙටි කාලයක් තුළදී මෙවැනි විශිෂ්ටයින් 3000 ක් රටට තිළිණ කිරීම අපගේ අපේක්ෂාවයි. මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ කාලය මාස 36 කි. එනම් අවුරුදු තුනකි. ඉන් මාස 24 ක් න්‍යායාත්මක දේශන හා අභ්‍යාසවල යෙදිය යුතු අතර ඉතිරි මාස 12 ප්‍රායෝගික අභ්‍යාසයන්හි (Practical Lessons) හා පැවරුම් වල සක්‍රීයව යෙදිය යුතුය. සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා ගාස්තුව රුː 350,000 ක් වේ. ඒ සඳහා බැංකු ණය පහසුකම් ලබාදීමටත් පුහුණු කාලය තුළ එම ණය පොලිය අපගේ ආයතනය මැදිහත්ව අනුග්‍රාහක දායකත්වය මත ගෙවීමටත් පියවර ගනු ලැබේ. දිවයිනේ සියලුම ප්‍රාදේශීය ලේකම් හා පළාත් පාලන ආයතන මට්ටමින් ස්ථාපිත කෙරෙන ත්‍රිභාෂා ඉගෙනුම් මධ්‍යස්ථානයන්හි පූර්ණ කාලීන ගුරුවරුන් වශයෙන් සේවයේ යෙදවීමටද මෙම උසස් ඩිප්ලෝමාධාරීන්ට අවස්ථාව හිමි කර දෙනු ලැබේ. එමෙන් ම තාක්ෂණ විශ්ව විද්‍යාලයට ඇතුළත්ව ඉතා කෙටි කාලයකින් B'Ed උපාධිය සම්පූර්ණ කිරීමට ද මෙම ඩිප්ලෝමාධාරීන්ට අවස්ථාව හිමිවේ.

### කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලාව (දින 10)

ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනයට සූදානම් වන තරුණ තරුණියන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශ නිලධාරීන් වෙනුවෙන් මෙම කෙටි කාලීන ඉංග්‍රීසි පුහුණු පාඨමාලාව සකසා ඇත. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල සිසුන්, විශ්ව විද්‍යාල ආයතන, වෘත්තීය අධ්‍යාපන ආයතන, උසස් අධ්‍යාපනය හදාරන සිසුන් මෙන්ම ජාත්‍යන්තර පාසල්හි අධ්‍යාපනයට යොමුවන සිසුන්ගේ ඉංග්‍රීසි භාෂාව ව්‍යාක්තව හැසිරවීමේ හැකියාව ලබාදීම මෙහි අරමුණ වේ. බත්තරමුල්ල නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ (IOLPS) වායු සමනය කළ ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන මෙම පාඨමාලාව පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා පැවැත්වේ. දිවා ආහාරය හා තේ පැන් සංග්‍රහ සහිතව මුළු පාඨමාලා ගාස්තුව රුː 22,500 කි. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ ඉංග්‍රීසි කතා කිරීමේ හැකියාව මනාව හැසිරවිම සඳහා මෙම පාඨමාලාව සතියේ දිනවල ප.ව. 5.00 සිට රාත්‍රී 9.00 දක්වා පැවැත්වේ.

### Mobile Language Lab (MLL) - ජංගම භාෂා විද්‍යාගාරය

එක්වර තිස් දෙනෙකුට අධ්‍යාපනය ලැබිය හැකි වායු සමනය කළ සුඛෝපභෝගී භාෂා විද්‍යාගාර බස්රථය ඉංග්‍රීසි දැනුම අපේක්ෂිත සිසු සිසුවියන් හා යෞවන යෞවනියන් වෙනුවෙන් ගම් දනව් කර පැමිණෙනු ඇත. දින 10 ක කාලය සීමාව තුළදී මෙම ජංගම භාෂා විද්‍යාගාරය තුළ සිට ඔබගේ ඉංග්‍රීසි දැනුම මුවහත් කරගැනීමට අවස්ථාව සලසා දෙනු ඇත.

ශ්‍රී ලංකාව තුළ සියලු ජාතීන් අතර සංහිදියාව සාමය සහ සුහදතාවය වර්ධනය කිරීමෙහි ලා සන්ධාන භාෂාව හෙවත් ජාත්‍යාන්තර භාෂාව වන ඉංග්‍රීසිය මනාව හැසිරවීම ඉතා වැදගත් බව යළි යළිත් ප්‍රකාශ කර සිටිමු. එබැවින්, ජීවිතයේ සෞභාග්‍ය අනාගත සෞභාග්‍ය ළඟාකරගැනීම සඳහා මෙම ලද අවස්ථාවවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම වැදගත් වේ.

## 2. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - නව විධිවිධාන

භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට අදාළව නව විධිවිධාන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 මගින් නිකුත් කොට තිබේ. ඒ අනුව මෙතෙක් නිකුත් කළ සියලුම භාෂා චක්‍රලේඛ මගින් හඳුන්වා දුන් විධිවිධාන වෙනුවට 2020.10.16 දිනෙන් පසු නව විධිවිධාන අදාළ වේ. එම චක්‍රලේඛය අනුව පහත සඳහන් කරුණු වැදගත් වේ.

**02. සම්පූර්ණ කර ගත යුතු භාෂා ප්‍රවීණතා මට්ටම් අනුව රාජ්‍ය නිලධර වර්ගීකරණය සහ නියමිත පාඨමාලා.**

2.1 රාජ්‍ය නිලධරයන් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගැනීමට අදාළ කාණ්ඩ වර්ගීකරණය හා ඒ ඒ කාණ්ඩයට අදාළව සම්පූර්ණ කළ යුතු පාඨමාලාවන්හි කාලසීමාව පහත දක්වේ.

| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සේවා මට්ටම | අදාළ වන කාණ්ඩය | පාඨමාලා කාලය |
|---|---|---|
| ප්‍රාථමික | 3 | පැය 100 |
| ද්විතීයික | 2 | පැය 150 |
| තෘතියික/ජ්‍යෙෂ්ඨ | 1 | පැය 200 |

2.2 ඉහත සියලුම පාඨමාලා සඳහා ලිඛිත හා වාචික යන කොටස් දෙකම ඇතුළත් විය යුතු අතර පාඨමාලා කාලය තුළ අඛණ්ඩ ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය.

2.3 නිලධරයෙකු ස්වකීය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා තමන්ට නියමිත භාෂා පාඨමාලා සඳහා අවම වශයෙන් 80% ක් හෝ එයට වැඩි සහභාගිත්වයක් තිබිය යුතුය.

2.4 දැනට සේවාරම්භක පුහුණු පැවැත්වෙන සියලුම තනතුරුවල සේවාරම්භක පුහුණුවේ කොටසක් ලෙස ඒ ඒ තනතුරුවලට අදාළව ඉහත 2.1හි සඳහන් පරිදි පාඨමාලා ඇතුළත් කිරීමට අදාළ පත්කිරීම් බලධරයන් ක්‍රියා කළ යුතුය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය බලාත්මක වන 2020.10.16 දින සිට අදාළ නිලධාරීන්ගේ භාෂා ප්‍රවීණතාව වසර තුනක් ඇතුළත අත්කර ගත යුතු වේ. එම භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකරන නිලධරයන්ට ලබාදිය යුතු වැටුප් වර්ධකය නියමිත සුදුසුකම් සම්පූර්ණ කරන තෙක් නතර කරනු ඇත. නියමිත භාෂා පාඨමාලාව සඳහා සහභාගි වීමට අවශ්‍ය නිවාඩු අදාළ ආයතන ප්‍රධානියා විසින් ලබාදිය යුතුය.

නව විධිවිධානවලට අනුව ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයට මෙම භාෂා පුහුණුව පවරා ඇති බව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වැඩිදුරටත් සඳහන් වේ.

නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය යනු ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් මෙම චක්‍රලේඛයෙහි සඳහන් භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීමට බලය පැවරූ හවුල්කාර ආයතනයකි. ඒ අනුව අප ආයතනය විසින් සිදු කෙරෙන මෙම භාෂා පුහුණු පාඨමාලාවලට අදාළ නියාමනය, අධීක්ෂණය සහ සහතිකපත් නිකුතුවද ඉහත ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් සිදු කරනු ලැබේ.

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ පාඨමාලා ගාස්තු පරිදි වේ.**

| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව සේවා මට්ටම | අදාළ වන කාණ්ඩය | පාඨමාලා කාලය | පාඨමාලා ගාස්තු එක් අයකුගෙන් |
|---|---|---|---|
| ප්‍රාථමික | 3 | පැය 100 | රු. 5,000 |
| ද්විතීයික | 2 | පැය 150 | රු. 10,000 |
| තෘතියික/ජ්‍යෙෂ්ඨ | 1 | පැය 200 | රු. 15,000 |

පාඨමාලා පැවැත්වීම ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කොට තීරණය කරනු ලැබේ. කෙසේ වෙතත් එක් පාඨමාලාවක් සඳහා සහභාගීත්වය 40 - 50 අතර වීම වඩාත් වැදගත් වේ.

**පුහුණුව ලබන ආයතනයේ කාර්යභාරය**

1. පුහුණුව සැලසුම් කිරීම, පුහුණුලාභීන් නම් කිරීම හා ඊට සහභාගි කරවීම.
2. දේශන සඳහා සුදුසු ශාලා පහසුකම් සැපයීම.
3. පුහුණු පාඨමාලා සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු නම් කිරීම.

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ කාර්යභාරය**

1. විෂයමාලා විෂය නිර්දේශවලට අනුව කටයුතු කිරීම.
2. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාඨමාලා පැවැත්වීම සහ එම ආයතනයේ ලියාපදිංචි දේශකවරුන් ඉගැන්වීම සඳහා යෙදවීම.
3. පුහුණුව තුළ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි ලිඛිත හා වාචික පරීක්ෂණ පැවැත්වීම, පුහුණුව අවසානයේ දී ඇගයුම සහ පරීක්ෂණ පැවැත්වීම.
4. ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය විසින් පුහුණුලාභීන් සඳහා නිකුත් කරන ලද සහතික පත්‍ර සැපයීම.

**පාඨමාලා ගාස්තු ගෙවීම**

පාඨමාලාව ආරම්භ කිරීමට නියමිත දිනට පෙර අදාළ ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය.

**පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම**

1. www.iolps.lk වෙබ් අඩවිය මගින් ලියාපදිංචිය.
2. නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ සාමාන්‍ය අයදුම්පත්‍රයක් සම්පූර්ණ කොට ලියාපදිංචි වීම.

දැනට රටේ පවතින සෞඛ්‍යය තත්ත්වය හා කඩිනමින් භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමේ අදහස පෙරදැරිව පුහුණු පාඨමාලා ඔන්ලයින් (Online) ක්‍රමයට ද සිදු කිරීමට අපේක්ෂිතයි.

# 3 දිවයින පුරා ත්‍රිභාෂා පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම

### 1. ව්‍යාපෘතිය පිළිබඳ මූලික හැඳින්වීම

ජාතික සමගිය හා සංහිදියාව ගොඩ නගමින් අභිමානවත් රටක් නිර්මාණය කිරීම රටවැසි, පුරවැසි අප සැමගේ උතුම් පරමාර්ථය වේ. සෑම සංස්කෘතිකාංගයේම මූලික කැඩපත භාෂාවයි. භාෂාව ඕනෑම ජාතියක අනන්‍යතාව ලොවට විදහාපාන මෙවලමක් ලෙස ද හැඳින්විය හැකිය. භාෂාව පිළිබඳ විචාර බුද්ධියකින් විමසා බැලීමේදී හුදෙක්ම එය ශබ්ද, පද, වාක්‍යන්ගෙන් සමන්විත අසිරිමත් නිර්මාණයකි. සරලව කිවහොත් ඔවුනොවුන්ගේ අදහස් හා අවශ්‍යතා දැනගැනීම හා සංහිදියාව ඇති කරලීම උදෙසා උපකාර වන මෙවලම භාෂාවය.

අධිරාජ්‍යවාදීන්ගෙන් මිදී නිදහස්, නිවහල් දේශයක ජීවත් වන අපි නිදහස් චින්තනයකට හා නිදහස් සංස්කෘතියකට උරුමකම් කියමු. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යනුවෙන් බෙදීම් ඇති කරගත නොගත යුතුය. සංස්කෘතිය විවිධාකාර වුවත් සියලු දෙනා මනුෂ්‍යයෝ වෙති. විවිධත්වයක් ඇති බව අවබෝධ වන්නේ සංස්කෘතිය හා භාෂාව මතය. විවිධත්වය හරිම විචිත්‍රය. නමුත් සංස්කෘතිය හා භාෂාව අවබෝධ කරගතහොත් එම වෙනස් බව හා විවිධත්වය මැකී යනු ඇත. ඒ අනුව සංහිදියාව හා සහෝදරත්වය වර්ධනය වනු ඇත. හුදෙක්ම භාෂාව අස්පර්ශනීය උරුමයක් විය යුතුය. භාෂාවේ ඇති නියමයන් හා සංයාමයන්වලට හානි නොකිරීමේ වගකීම ඇත්තේ ඒ නිසාය. එමනිසා භාෂාව පණ මෙන් රැකිය යුත්තේය. IOLPS විසින් මෙම වගකීම් භාරය හඳුනාගෙන ත්‍රි භාෂා ඉගෙනුම් මධ්‍යස්ථාන පිහිටුවීම හා ඉංග්‍රීසි භාෂාව ඉගන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

### 2. ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවය

පාසල් යන මුල් අවධියේ සිට නොව ඇතැම් විට පූර්ව ළමාවිය අවධියේදී පවා ඇතැම් ඉංග්‍රීසි වදන් ළමා පරපුරට නියැතින්ම ශ්‍රවණය වනු ඇත. එමෙන්ම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය දක්වා අඛණ්ඩව වසර 11ත් සෑම දරුවකුම තම පාසල් ජීවිතය තුළ ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම සිදුවේ. භාෂාවේ ඉගැන්වීමේ පවතින අසමසම පරතරය හේතුවෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභගායේදී ඉදිරිපත් වන මුළු අපේක්ෂකයන්ගෙන් 60%ක්ම ඉංග්‍රීසි භාෂාව අසමත් වෙති. මෙම භාෂාවෙහි ව්‍යක්ත බව ලබන ප්‍රමාණය 10%කටත් අඩුය. තවත් 20% ක් පමණ භාෂාව මධ්‍යම මට්ටමින් හැසිරවීමට නිපුණතාලාභීන් වේ. අප දන්නා පරිදි රාජ්‍ය සේවයට ප්‍රවිෂ්ට වීමට ඉංග්‍රීසි භාෂාව මධ්‍යම මට්ටමින් අවශ්‍ය වේ. පෞද්ගලික අංශයෙන් ඉහළ රැකියා අවස්ථා ලබන්නට හා ජාත්‍යන්තරය ජයගන්නට මෙම දැනුම ඉහළ මට්ටමක තිබිය යුතුය. මෙම අභියෝගය ජයගැනීම ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවය වී තිබේ.

### 3. රාජ්‍ය භාෂාවන් හා සන්ධාන භාෂාව පිළිගැනීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි IV වන පරිච්ඡේදයේ 8-25 දක්වා වූ වගන්තිවලින් සිංහල හා දෙමළ භාෂාවන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වශයෙන් පිළිගෙන තිබේ. එමෙන්ම ඉංග්‍රීසි හෙවත් ජාත්‍යන්තර භාෂාව අප සන්ධාන භාෂාව වශයෙන් අර්ථකථනය කොට තිබේ. රාජ්‍ය සේවයට බැඳීමේ අනිවාර්ය කොන්දේසියක් ලෙස මෙම භාෂා ප්‍රවීණතාවය වැදගත් වේ. ඒ අනුව රාජ්‍ය සේවයේ තම සේවාව ස්ථිර කර ගැනීම, උසස්වීම් ලබාගැනීම, කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම වෙනුවෙන් ද්වි භාෂා ප්‍රවීණතාවය වැදගත් වේ. මෙම කොන්දේසිය 2007 වසරේ සිට ක්‍රියාත්මක වුවත් අපේක්ෂිත පරමාර්ථ ඉටුවීම ප්‍රමාද වෙමින් පවතී. ඒ නිසා උතුරට යන සිංහල වැසියන් ගොළුවන් සේ හැසිරෙන අතර දකුණට සපැමිණෙන දමිළ වැසියන්ද භාෂාව නිසා මුනිවත රකින තත්ත්වයක් උදාවී තිබේ. සන්ධාන භාෂාව හෙවත් ජාත්‍යන්තර භාෂාව මෙම භාෂා ගැටලුව සමනය කරන පාලමක් වේ. එබැවින් රාජ්‍ය භාෂා ඉගෙනුම මෙන්ම සන්ධාන භාෂාව මනාව ඉගෙනීමද ඉතා වැදගත් වේ. මෙම කාර්යය ඉතා බැරෑරුම් කටයුත්තක් වන බැවින් රාජ්‍ය අංශයට පමණක් තනිවම කළ හැක්කක් නොවේ. එබැවින් සාමූහික ප්‍රශ්නයක් ලෙස ජාතික අවශ්‍යතාවයක් ඉටුකිරීම සඳහා නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයද ඊට මැදිහත් වේ.

## 4. ත්‍රි භාෂා ඉගැනුම් මධ්‍යස්ථාන පිහිටුවීම

රාජ්‍ය භාෂාවන් වන සිංහල හා දෙමළ මෙන්ම සන්ධාන භාෂාව වන ඉංග්‍රීසිය එකම මධ්‍යස්ථානයකින් ඉගෙනීමට හැකි නම් එහි වටිනාකම අතිශෝක්තියක් නොවේ. දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 පාදක කොට ගෙන එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය බල ප්‍රදේශය ආවරණය වන ලෙස ත්‍රි භාෂා ඉගෙනුම් මධ්‍යස්ථාන 03 බැගින් පිහිටුවීම අපේක්ෂිතය. දිවයිනේ වැඩිම ජනගහනයක් සිටින කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මෙන්ම අඩුම ජනගහනයක් සිටින ඩෙල්ෆ් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දක්වා එකසේ මෙම පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කරනු ලැබේ. ඒ අනුව ස්ථාපිත කෙරෙන ත්‍රි භාෂා මධස්ථාන ප්‍රමාණය 900කි. මේ සඳහා රාජ්‍ය මුදල් හෝ රජයේ ඉඩම් යොදා ගැනීමට අපේක්ෂ නොකෙරේ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම හඳුනාගත් ව්‍යවසායකයන් තිදෙනකු නිර්මාණය කිරීම අපගේ ව්‍යායාමයය. ඔවුන් තමන්ගේ සම්පත් යොදා මෙම මධ්‍යස්ථාන ඉදිකරනු ලැබේ. අවශ්‍ය ප්‍රාග්ධනය වෙනුවෙන් පිළිගත් බැංකු ණය ලබා ගැනීමට අපේක්ෂිතය. එක් මධ්‍යස්ථානයක ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 3.5ක් වන අතර ඉගෙනුම් භාෂා පුහුණු මධ්‍යස්ථානයන්හි විශේෂත්වය නම් පොදුවේ ඉංග්‍රීසි භාෂාව ඉගැනීමට පහසුකම් සැලසීමයි.

එමෙන්ම සිංහල කථාකරන ප්‍රදේශන්හි දෙමළ භාෂාව ඉගැන්වීමටත් දෙමළ භාෂාව භාවිතා වන ප්‍රදේශවල සිංහල භාෂාව පුහුණු කිරීමට පහසුකම් සැලසීමත් එනම් රට තුළ සංහිදියාව ඇති කරන නව පාලම මෙම ත්‍රි භාෂා පුහුණු මධ්‍යස්ථාන වනු ඇත. නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයෙන් පුහුණුව ලත් සිංහල හා දෙමළ භාෂා උපදේශකවරුන් මෙහි සේවයට යොදවා ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිරියේදී බඳවා ගන්නා ඉංග්‍රීසි ගුරුවරුන් තම ජීවනෝපාය ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම අපේක්ෂිත ප්‍රතිඵලය වේ.

## 5. ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් බිහි කිරීම

නූතන ලෝකයේ අභියෝගවලට මුහුණදීම සඳහා ඉංග්‍රීසි භාෂාව ඉතා හොඳින් හැසිරවීමේ හැකියාව වර්තමානයේදී අත්‍යවශ්‍ය සාධකයක් වේ. එම හැකියාව සමාජයේ ටික දෙනකුට නොව සියලු දෙනාටම ලැබිය යුතු වේ. ඒ සඳහා වඩාත් ආකර්ශනීය හා ඵලදායි වූ භාෂා ඉගැන්වීම සඳහා වන නූතන තාක්ෂණ භාවිතයන්ගෙන් යුත් ක්‍රමවේදයක් රටට හඳුන්වාදිය යුතු වේ. ඒ සඳහා සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අවම වශයෙන් ත්‍රි භාෂා පුහුණු මධ්‍යස්ථාන 03 බැගින් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. මෙම මධ්‍යස්ථාන පාදක කොටගෙන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ගුරුවරුන් 2700ක් බඳවාගෙන පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවේ.

ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් ලෙස මෙම පාඨමාලව හැඳින්වේ. එය ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම සම්පූර්ණ වන අතර 6 වන මට්ටමට සුදුසුකම් ලබාගනී. එසේම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් NVQ 6 වන මට්ටම අනුමත කළ වහාම එම සහතිකයට ද ඉල්ලුම් කළ හැකිය.

මෙම ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගැනීම පහත සඳහන් පරිදි සිදුවේ.

1. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම තරුණ තරුණියන් දස දෙනකුට අයදුම්පත් ඉදිරිපත් කළ හැක. අයදුම් කිරීමට අධ්‍යාපන සුදුසුකම වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. උසස් පෙළ විභාගය ප්‍රධාන විෂයයන් තුන සමත් වී තිබීමයි. (2020 අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අයටද අපේක්ෂිත ප්‍රතිඵල මත ඉල්ලුම් කිරීමට අවකාශ සලසා දෙනු ලැබේ.)

2. පුහුණුවට බඳවාගනු ලබන්නේ වයස අවුරුදු 18 - 40 අතර වයස් කාණ්ඩයන්ට අයත් පුද්ගලයන් පමණි.

3. අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබාදීමට කටයුතු කෙරේ. මෙම කාර්යය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිපුණතා සංවර්ධන නිලධාරි, මානව සම්පත් නිලධාරි හෝ වෙනත් සුදුසු නිලධාරියකුට පැවරිය හැකි වේ. අයදුම්පත් ලබාදීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය නියෝජනය වන පරිදි එම අයදුම්පත් බෙදාහැරීම සුදුසු වේ.

4. මෙම පාඨමාලාවට බඳවාගැනීම සඳහා ලැබෙන අයදුම්පත් සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් මට්ටමින් එක්දින වැඩමුළුවක් පවත්වනු ලැබේ. එහිදී දක්වන කාර්යසාධන මට්ටම සැලකිල්ලට ගෙන එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් 06 දෙනකු බැගින් මෙම පුහුණුවට බඳවා ගනු ලැබේ.

5. මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා තෝරාගනු ලබන ආධුනිකයන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට සැලසුම් කර ඇති අතර ආර්ථික දුෂ්කරතාවයන් හා විශේෂ දක්ෂතාවයන්ගෙන් යුත් දරුවන් තෝරා එවන්නේ නම් වඩාත් ඵලදායි වනු ඇත.

සංෂිප්තව දැක්වුවහොත් වසර 03ක කාල සීමාව අවසානයේදී පහත සඳහන් ප්‍රතිලාභ රටට හිමිවනු ඇත.

1. ත්‍රි භාෂා ඉගෙනුම් මධ්‍යස්ථාන 900ක් රට තුළ අලුතින් ඉදිවීම.
2. දිවයින පුරා පුහුණු ව්‍යවසායකයන් ජාලයක් බිහිවීම.
3. රට තුළ උසස් අධ්‍යාපනයට හිමිකම් ලබමින් තරුණ තරුණියන් 3000ක් ඉංග්‍රීසි භාෂාවෙන් සවිමත් වීම.
4. ඉංග්‍රීසි භාෂාවට අමතරව සිංහල භාෂාව ඉගැනවීමට ගුරුවන් 100ක් හා දෙමළ භාෂාව ඉගැන්වීමට ගුරුවන් 900 ක් බිහිවීම.
5. ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් 3000 බිහිවීම හා ඔවුන් වෘත්තීය වශයෙන් ගුරුවරන් වශයෙන් කටයුතු කරමින් සමාජ මෙහෙවරට දායක වීම.
6. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම තුළින් වක්‍ර රැකියා 5000 සමාජය තුළ ජනිත වීම.

### 6. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම

ත්‍රි භාෂා ඉගනුම් මධ්‍යස්ථාන පිහිටුවීම හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයෙහි තවත් ව්‍යාපෘතියකි.

## 4. පළාත් පාලන ආයතන මානව සංවර්ධනයෙන් සවිමත් කිරීම

පළාත් පාලනය පිළිබඳව ලංකාවට ඇත්තේ දිගුකාලීන ඉතිහාසයකි. එය ක්‍රි. පූ. 4 වන සියවස තරම් ඈතට දිව යයි. නගර පාලනය උදෙසා නගරගුත්තික ධුරයක් එකල පැවති බවට මහාවංශය සාක්ෂි දරයි. අනුරාධපුර නගරයෙහි නගර ගුත්තිකයකු යටතේ පැවැති අංගසම්පූර්ණ කාර්යක්ෂම පාලන ක්‍රමයක් පැවති බව ඒ අනුව පැහැදිලි වෙයි.

ගම් සභාව යනු ලක්දිව ග්‍රාම පාලනය පිළිබඳව බොහෝ සෙයින් ඉපැරණි අංගයක් විය. අතීතයේදී ගම්සභාව සැදුම් ලද්දේ තලතුනා, සැලකිය යුතු ප්‍රභූ පුද්ගලයන්ගෙනි. ඔවුන් රැස් වූයේ අම්බලමක, විසල් තුරුසෙවණක හෝ වෙනත් පහසු ස්ථානයකය. ගමෙහි සිදුවන සුළු අපරාධ සඳහා දඬුවම් නියම කිරීමත්, ආරවුල් නිරාකරණය කිරීමක් ද එමගින් සිදු විය. ඒ අනුව සොරකම, අඬදබර, කෝලාහල, ණය ගනුදෙනු ආරවුල් ආදිය විසඳන ලද්දේ ගම්සභාව විසිනි. 1818 දී ලංකාවට පැමිණ හමුදා සෙබළෙක්ව සේවය කොට 1842 දී මහාමාර්ග කොමසාරිස් ධුරයට පත් මේජර් තෝමස් ස්කිනර්, ඔහු දුටු ගම්සභා ක්‍රමය විස්තර කරනුයේ මෙසේය.

''ස්වදේශීය ආණ්ඩුවෙහි ගන්සයිබ්'' නැතිනම් ''ගම්සභිබ්'' යනුවෙන් සරල පිහිටුවීමක් තිබේ. මේවා පළමු කොට ඇති වූයේ ඉන්දියාවේ ද, නැතිනම් ලංකාවේද යනුවෙන් පැවැසීමට මට නොහැකිය. වචනයේ පළමු අක්ෂර වලින් කියැවෙන්නේ සිංහලෙන් ගමට කියැවෙන නමයි. දෙවැන්නෙන් කියැවෙන්නේ හින්දුස්තාන්වලින් ''ස්වාමියා නැතිනම් පාලකයා'' යන්නට කියන නාමයකි. උතුරු ඉන්දියාවේ, පංජාබයේ පැරණි ආණ්ඩුක්‍රමවල මේවා තිබුණු බවට අපි අසා ඇත්තෙමු.

මේ ගම් සභාවල වැඩිහිටියෝ තුන් දෙනෙක් හෝ පස්දෙනෙක් ඇත්තාහ. මොවුන් විශාල ගමකින් හෝ යාබද කුඩා ගම් කීපයකින් සැකැසෙන පිරිසකි. මොවුන් තෝරාගනු ලබන්නේ ගම්මුන් වන සේම, ඔවුන්ගේ රැස්වීම් ආදි සියලු කටයුතු සිදු කෙරෙන්නේ ගමේ තිබුණු සැලකිය යුතු අතුපතර විහිදුණු විශාල ගසක් යටදීය.

මේ ගම්සභාවලට ලැබී ඇති බලතල කොයි කාලයකදී සිට පැවතෙන එකක් දැයි මම නොදනිමි. එහෙත් සුළු සුළු ආරවුල් ඈත ගම්බද දිස්ත්‍රික්කවල අඩු කිරීමට ඒවා සමත් වී තිබේ. දබර සහ ආරවුල් ඒවා සිදුවුණු තැන්වලදී මෙය සිදුකරන නිසා කලින් අරමුණු කරගත් බොරු දිවුරුම් ආදී දේවලට මෙහි දී ඉඩක් නොලැබේ. සෑම සිදුවීම් දහයකින් නවයක තීරණවලට කෝලාහලයකට මැදි වූ පක්ෂ එකඟ වෙන බව මට කීමට පිළිවන. එහෙත් මෙවැන්නකදී වුව ඕන පිරිසකගේ කෙනෙකුට තම නඩුව ඉහළ උසාවියකට ඉදිරිපත් කිරීමට ඉඩකඩ තිබේ. එහෙත්, නඩුව විභාග කිරීම පළමුව ගමේ වැඩිහිටියන් ඉදිරියේ සිදු වුණු බැවින් බොහෝ අවස්ථාවලදී කිසිවකුට කලින් සැළසුම් කරන ලද බොරු සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩකඩක් නොලැබී යයි.

ගම් සභාවල කටයුතු මෙසේ අමුතු ක්‍රියාකාරිත්වයකින් සිදු වෙද්දී, ඔවුනට නාගරික ශාලා වැනි දෙයක් ඉදිකර දිය යුතු වේ. ඔවුන්ට ඒවායෙහි තම කාර්යයන්ගේ අත්තිවාරම දමා ගැනීමට හැකි වේ. සුදුසුකම්, තෝරා ගැනීම් සහ ක්‍රියාකාරිත්වයන් ලෙහෙසියෙන්ම කළ හැකි වේ.

මේ කරුණු මෙසේ සිදු වෙද්දී, සෑම පළාතකම, දිස්ත්‍රික්කයකම සහ ගමකම සිටින්නා වූ නායකයන්ගේ ප්‍රමාණය කාර්යයන් සහ බලතල, හොඳ පරීක්ෂාවකින් පසුව යළිත් පුනරීක්ෂණය කොට නීතිමය වශයෙන් හඳුනා ගනිමු. ගම්සභාවලට සම්බන්ධව කටයුතු කරන ආණ්ඩුවේ ඒජන්තවරුන්ට සහ ඔවුනගේ නියෝජිතයන් (සාමදාන විනිශ්චයකරුවන්ට) සීමාසහිතව අප රට අධිකරණ කටයුතු භාර දෙමු. ඊට අමතරව ඔවුනට හරක් හොරුන්ට දඬුවම් පැමිණවීමේ අධිකරණ බලයද පැවැරීම තහවුරු කළ යුතුව ඇත...''

(Fifity years in Ceylon - Major Thomas skinner පරිවර්තනය - පරාක්‍රම ඇස්. විජේවර්ධන)

1856 දී පැනවූ, 1856 අංක 09 දරන කුඹුරු ඉඩම් සහ වාරිමාර්ග ආඥා පනත යටතේ නැවත වරක් මේ ගම් සභා පිහිට වූ අතර, පෙර පැවති නඩු හබ විසඳීම වැනි කාර්යයන්ගෙන් පූර්ණ වශයෙන් ඉවත්ව පැවති

ගම් සභා මෙන් නොව මෙය නෛතික බලයක් සහිත පළාත් පාලන ඒකකයක් විය. රජයේ දිසාපති හෝ උප දිසාපති එහි මුලසුන දැරූ අතර අනෙකුත් සාමාජිකයන් පත් කරන ලද්දේ ඔහු විසිනි.

1861 පනවන ලද 1861 අංක 10 දරන මාර්ග කමිටු ආඥා පනත මගින් පළාත්බද මාර්ග කමිටු සහ දිස්ත්‍රික් මාර්ග කමිටු පිහිටුවිණි. පොදු මාර්ග පද්ධතිය නඩත්තු කිරීම එමගින් සිදු විය.

1848 දී ඇති වූ කැරැල්ලට හේතු වූ කරුණු සොයා බලා වාර්තා කිරීමට විශේෂ කමිටුවක් පත් කළ අතර, එහි නිර්දේශයන් පිළිබඳව අවධානය යොමු කළ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව කොළඹ නගරයට මහා නගර සභාවක් ලබා දෙන ලෙස යෝජනාවක් 1850 දී සම්මත කරන්නට යෙදුණි. ඒ සඳහා අණපනත් පිළියෙල කරන ලද්දේ ප්‍රසිද්ධ රාජ නීතිඥයකු වූ රිචඩ් මෝගන් විසිනි. කෙසේ වෙතත් කොළඹ නගරය තුළ නාගරික සභාවක් සංස්ථාපනය කිරීම සඳහා ව්‍යවස්ථාදායක මන්ත්‍රන සභාව වෙත පනතක් ඉදිරිපත් වන්නේ 1865 දී වන අතර, එය ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුකාරවර සර් හර්කියුලස් රොබින්සන් විසිනි.

1865 නොවැම්බර් මස 25 දින කොළඹ මහා නගර සභාවේ නගර සීමාවන් නියම කිරීමේ නිවේදනය නිකුත් කරනු ලැබීය. 1866 ජනවාරි 05 දින කොළඹ මහා නගර සභාව සඳහා ආණ්ඩුකාර වරයා විසින් පත් කරන ලද සභිකයන් ප්‍රකාශයට පත් කළ අතර 1866 ජනවාරි 12 දින සිට 15 දින දක්වා පැවති ඡන්ද විමසීමෙන් සභිකයින් 09 දෙනෙකු පත් කරගන්නා ලදී. ආණ්ඩුකාරවරයා විසින් සභිකයින් 05 දෙනෙකු පත් කරන්නට යෙදුණි. පත්කළ මන්ත්‍රී, රජයේ දිසාපති, සී. පී. ලෙයාඩ් මහතා සභාපතිවරයා ලෙස පත්කරන ලදී. තෝරා ගන්නා ලද සභිකයන්ද සමඟ පළමු නගර සභා රැස්වීම 1866 ජනවාරි 16 දා පැවැත්වුණි.

මහනුවර මහා නගර සභාව සහ ගාල්ල මහනගර සභාව 1866 වසරේදීම සංස්ථාපනය වූ අතර ඊට අදාළ ආඥා පනත්ද සම්මත කර ගැනුණි.

1871 දී ගෙන එන ලද 1871 අංක 26 දරණ ග්‍රාම ප්‍රජා පිළිබඳ ආඥා පනත සමඟ ගම්සභා නැවත ව්‍යවස්ථාගත කරන ලදී. මුල් කාලීනව ග්‍රාම කමිටු ලෙස හැඳින්වුනු මේවා පසුකාලීනව ගම් කාර්ය සභා ලෙස හඳුන්වන්නට යෙදුණි. අදාළ ප්‍රදේශයේ ගම්වාසීන්ගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා සහ ව්‍යවස්ථාදායකය විසින් ග්‍රාම කමිටුවක් පත් කළ අතර, මුලසුන දරන ලද්දේ රජයේ ඒජන්තවරයා විසිනි. සුළු අපරාධ සහ සුළු ආරවුල් පිළිබඳව අධිකරණය බලයක්ද ග්‍රාම කමිටු සඳහා ලැබුණි. 1884 වර්ෂයේ දී ග්‍රාම කමිටු ආඥා පනතට ගෙන එන ලද සංශෝධනයක් අනුව ග්‍රාම කමිටුවේ සභාපතිවරයා ලෙස ගම්මුලාදෑනියා නිල බලයෙන් පත් විය.

1892 අංක 18 දරන සනීපාරක්ෂක මණ්ඩල ආඥා පනත අනුව කුඩා නාගරික ප්‍රදේශයන්හි පොදු සෞඛ්‍ය සේවා, ජලපවාහනය, මලපවාහනය, පොදු වෙළඳ සැල ආදී මහජන සේවාවන් ඉටු කිරීම උදෙසා සනීපාරක්ෂක මණ්ඩල පිහිටුවන ලදී.

1898 අංක 13 දරන ප්‍රාදේශීය මණ්ඩල ආඥා පනත අනුව විශාල නගර සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මණ්ඩල සංස්ථාපනය කෙරුණි. මෙහි මීට පෙර සංස්ථාපනය කරන ලද කාර්යයයන්ද සනීපාරක්ෂක මණ්ඩලයන්හි කාර්යයන් හා සමාන විය. මලපවාහනය, ජලපවාහනය හා සෞඛ්‍ය සේවා සැපයීම ඉංග්‍රීසි බසින් sanitary board ලෙස හැඳින්වූ සනීපාරක්ෂක මණ්ඩලවල ප්‍රධානතම කාර්යයන් විය. වත්මනෙහි වුවද ජනවහරේ යෙදෙන "සැන්ටිබෝඩ්" යන්න sanitary +board = santi + board යන්නෙන් බිඳී සකස් වූවක් විය.

1920 අංක 11 දරන පළාත් පාලන ආඥා පනත අනුව නාගරික දිස්ත්‍රික් සභා ප්‍රාදේශීය දිස්ත්‍රික් සභා සහ පොදු සභා පිහිටුවන්නට යෙදුණි. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත යටතේ තරමක් විශාල නගර සඳහා නගර සභා පිහිටුවන ලදී. ඒ අනුව ස්ථාපිත කරන ලද නගර සභා සංඛ්‍යාව 27 ක් විය.

1945 අංක 03 දරන සුළු නගර සභා ආඥා පනත යටතේ කුඩා නගර සඳහා සුළු නගර සභා පිහිටු වූ අතර, සනීපාරක්ෂක සභා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය හා සනීපාරක්ෂක සභා අහෝසි කරන ලදී. ඒ අනුව පිහිටුවන

ලද සුළු නගර සභා සංඛ්‍යාව 24 ක් වන අතර පොදු මාර්ග, මහජන සෞඛ්‍ය, පොදු පහසුකම් සැපයීම සහ ආදායම් එකතු කිරීම එහි කාර්යයන් අතර විය.

ඉහත සඳහන් සියලුම ආයතනයන්හි සේවක මණ්ඩලය බඳවා ගැනීම ඇතුළු පරිපාලනමය කටයුතු උදෙසා ආයතනගත ක්‍රමවේදයක් පැවති අතර සේවක වැටුප් ප්‍රමාණයන් එකී ආයතනයන් සතු මූල්‍යමය හැකියාව අනුව සකස් වී තිබුණි. ඇතැම් පළාත් පාලන ආයතන මගින් පශ්චාත් විශ්‍රාමික සුභ සාධක ක්‍රමයක් ලෙස විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක වූ අතර ඒ වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ගැනීම උදෙසා අවැසි ප්‍රතිපාදන අදාළ ආඥාපනත්වලින්ම සළසා තිබුණි. ඒ අනුව එවක පැවති මහා නගර සභා සහ ඇතැම් ගම් සභා විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා සකස් කොටගෙන අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ ආයතනයක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කොට තිබුණි. 1946 අප්‍රේල් 01 දක්වාම මෙම ක්‍රමය ඒ ඒ පළාත් ආයතන තුළ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙමින් පැවතුණි. පළාත් පාලන ආයතන තුළ කාලානුරූපව පහත සඳහන් ප්‍රවර්ධනයන් සිදුවිය.

1856 ඉතා සීමිත කාර්ය භාරයක් සහිතව ස්ථාපනය කළ ගම් සභා ක්‍රමය.

1860-61 පළාත් මාර්ග කමිටු හා දිස්ත්‍රික් මාර්ග කමිටු ලෙස පළාත් පාලන ආයතන දෙවර්ගයක් පිහිට වූ අතර ඒවාට මාර්ග ඉදිකිරීම් හා නඩත්තුව පවරන ලදී.

1865 අංක 17 දරණ මහා නගර සභා පනත හඳුන්වා දෙමින් සර් හර්කියුලිස් රොබින්සන් ආණ්ඩුකාරවරයා විසින් කොළඹ මහා නගර සභාව ස්ථාපනය කිරීම.

1866 මහනුවර හා ගාල්ල මහා නගර සභා ඇති කිරීම.

1871 ගම් කාර්ය සභා පනත හඳුන්වා දීම හා ඒ අනුව දිවයින පුරා ග්‍රාමීය කමිටු පිහිටුවීම.

1892 සනීපාරක්ෂක මණ්ඩල පනත යටතේ සනීපාරක්ෂක මණ්ඩල (Sanitary Board) කුඩා නගර ආශ්‍රිතව පළාත් පාලන ආයතන ලෙසින් පිහිටුවීම.

1898 ප්‍රාදේශීය මණ්ඩල (Local Board) නමැති නව පළාත්පාලන අයාතන විශේෂයක් හඳුන්වා දීම.

1900 මුල් දශකය තුළ මෙරට වතු ආර්ථිකයෙහි ප්‍රමුඛ මධ්‍යස්ථානයක් වූ නුවරඑළිය නගරය සඳහා නුවරඑළිය සංවර්ධන මණ්ඩලය නම් වූනව පළාත් පාලන ආයතනයෙන් හඳුන්වා දීම.

1920 අංක 11 දරණ පළාත් පාලන ආඥා පනත අනුව නව පළාත් පාලන ආයතන වර්ග 3ක් හඳුන්වාදීම.

- මහා නගර සභාවලින් බාහිර ප්‍රදේශ නාගරික සඳහා නාගරික දිස්ත්‍රික් සභා.
- පොදු දිස්ත්‍රික් සභා.
- ඌන සංවර්ධිත ප්‍රදේශ සඳහා ග්‍රාමීය දිස්ත්‍රික් සභා.

මෙම ආයතන ඇති කරනු ලැබුවේ 1916 වර්ෂයේදී එවකට පැවති පළාත් පාලන ක්‍රමයට සංශෝධන ගෙන ඒම සඳහා ප්‍රේසර් කොමිෂන් සභාව සිදු කළ නිර්දේශ සැලකිල්ලට ගනිමිනි. කෙසේ වෙතත් විවිධ අඩුපාඩු හා මහජන විරෝධතා හේතුවෙන් මෙම පළාත් පාලන ආයතන ප්‍රචලිත නොවීය.

1931 ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව අනුව නව ආණ්ඩුක්‍රමය යටතේ ඇති කරන රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කාරක සභා ක්‍රමයක් සහිත වූ අතර එකී කාරක සභා අතර පළාත් පරිපාලනය භාරව කටයුතු කිරීමටත් පළාත් පරිපාලන ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහාත් එක් විධායක කාරක සභාවක් ඇති කිරීමට (Excutive Committe on Local Administaration) නිර්දේශ කරන ලදී.

දෙවනුව එතෙක් පළාත් පාලන භාරව කටයුතු කළ පළාත් පාලන මණ්ඩලය (Local Government Board) අහෝසි කොට ඒ වෙනුවට දිවයිනේ පළාත් පාලනය භාරව කටයුතු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව නම් වූ විශේෂ ආයතනයක් පූර්වෝක්ත විධායක කාරක සභාවේ පාලනයට යටත්ව පිහිටුවීම.

වර්තමානයේදී පළාත් පාලන ව්‍යුහයෙහි ඒකක කිහිපයක්ම දක්නට ලැබේ. එනම් විශාල නගර සඳහා ක්‍රියාත්මක වන මහ නගර සභා ක්‍රමයයි. මෙවැනි මහ නගර සභා 21ක් මේ වන විට ස්ථාපිතව පවතී. දෙවැන්න නගර සභා ලෙස හඳුන්වනු ලැබේ. නාගරීකරණය සඳහා පියනඟන මෙවැනි පළාත් පාලන ආයතන 41ක් රට තුළ ක්‍රියාත්මක වේ. මහ නගර සභා හා නගර සභා යටතට නොගැනෙන ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සභා ස්ථාපිතව ඇත. රට තුළ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාදේශීය සභා 257ක් මේ වන විට ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය සභා හඳුන්වාදීමේ පරමාර්ථය වූයේ පරිපාලන සංවර්ධන කටයුතුවලට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට ප්‍රාදේශීය මට්ටමින් ඵලදායි ලෙස සහභාගි වීම සඳහා ජනතාවට වැඩි අවස්ථා සලසාදීමයි.

ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් ඵලදායි ලෙස සහභාගි වීම සඳහා ජනතාවට වැඩි අවස්ථා සලසාදීමේ අරමුණු ඇතිව ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා එම සභාවල බලතල කාර්යයන් හා කර්තව්‍යයන් නිශ්චය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශාංගික සියලු විධිවිධාන සැලැස්වීම වේ. ප්‍රාදේශීය සභා පනතෙහි අන්තර්ගතයට එහි සංස්ථාපනය, නිල තත්ත්වය, මංමාවත්වලට අදාළ බලතල හා කාර්යයන් මහජන සෞඛ්‍ය පිළිබඳව බලතල හා කාර්යය, මුදල් කටයුතු, ප්‍රාදේශීය සභා අධීක්ෂණ හා පාලනය පරිපූරක විධිවිධාන මෙන්ම සාමාන්‍ය කරුණු ද ඇතුළත් වේ.

**රට හදන ගමේ ආණ්ඩුව ප්‍රාදේශීය සභාවන්හි කාර්ය සාධනය ඉහළ නැංවීමේ ව්‍යාපෘති ගණනාවක් නිල භාෂා හා වෘත්තිය අධ්‍යයන ආයතනය විසින් හඳුන්වා දී තිබේ.**

**1. නායකත්ව සංවර්ධන දෙදින වැඩමුළුව**

ග්‍රාමීය ආර්ථිකයෙහි පලදායී සංවර්ධනයක් ඉටුකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පාදක කොට ගනිමින් පැවැත්වෙන දෙදින වැඩසටහනකි. ප්‍රාදේශීය වශයෙන් පවතින සම්පත් හඳුනාගැනීම, දැනුම කුසලතා හා යහපත් ආකල්ප සංවර්ධනය, ගම් මට්ටමින් ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම් කිරීම, තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම මෙන්ම ප්‍රාදේශීය නායකත්වයෙහි අනාගත අපේක්ෂා ඉටු කිරීම වෙනුවෙන් මෙම වැඩමුළුව සංවිධානය කෙරේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පාලනයෙහි මූලිකත්වය ගන්නා ප්‍රාදේශීය සභාවන්හි සියලුම මහජන නියෝජිතයන් හා මාණ්ඩලික නිලධාරීන් අරමුණු කොට පැවැත්වෙන මෙම වැඩමුළුව ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි සුදුසු ස්ථානයක් තෝරාගෙන නේවාසික හෝ නේවාසික නොවන ආකාරයට පැවැත්විය හැකිය. නායකත්ව වැඩමුළුවෙහි අන්තර්ගතය තුළ ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන්ගේ නායකත්ව ශූරතාව, නායකත්වය මුහුණදෙන අභියෝග, නායකත්වය සඳහා දැනට කුසලතා හා ආකල්ප සංවර්ධන උපාය මාර්ග හඳුනාගැනීම ගමේ සංවර්ධනය, සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම, ප්‍රජාමණ්ඩල පිහිටුවීම හා එහි ක්‍රියාකාරිත්වය, ගමට සංවර්ධන සැලැස්මක් සම්පාදනය. සියලුම පවුල් ඒකක සඳහා සමාජ ආර්ථික සැලැස්මක් සකස් කිරීමේ වැදගත්කම, එම දත්ත විශ්ලේෂණය කිරීම හා අවශ්‍යතාවයන් හඳුනාගෙන සුදුසු වැඩපිළිවෙළක් දියත් කිරීම මෙන්ම 2015 - 2030 දක්වා ක්‍රියාත්මක වන සහශ්‍ර සංවර්ධන ඉලක්ක ප්‍රාදේශීය මට්ටමින් සපුරා ගැනීමේ ක්‍රමවේදය ඇතුළත් වේ. තවදුරටත් නායකත්ව ගුණාංග වර්ධනය කරගනිමින් අනාගත අභියෝග සඳහා මුහුණ දීම. 2015 - 2030 තිරසර සංවර්ධන ඉලක්ක ගම් මට්ටමින් සපුරාගනු ගැනීම. ප්‍රාදේශීය සභා මට්ටමන් ජීවත් වන සියලුම පවුල් ඒකක වෙනුවෙන් සකස් කෙරෙන සමාජ - ආර්ථික සමීක්ෂණ දත්ත ප්‍රයෝජනයට ගැනීම. ප්‍රාදේශීය සභා සංවර්ධන වැඩපිළවෙළ ගමට ගෙනයාමට ප්‍රජා මණ්ඩල කාර්යභාරය වැඩිදියුණු කිරීම. ගම නියෝජනය කරන සැබෑ නායකයා වශයෙන් වෙනස්විය යුත්තේ කෙසේද හා අනාගතය රටේ සංවර්ධනයට කැපකරන්නේ කෙසේද යන්න පුළුල්ව සලකා බැලීම සිදුවේ.

### 2. ගරු මහජන නියෝජිතයන් සඳහා ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන

මෙය පළාත් පාලන මහජන නියෝජිතයන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධන සඳහා දිවයිනේ ක්‍රියාත්මක වන එකම ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව වේ. පළාත් පාලන ආයතන හා එහි වගකීම, කාර්යභාරය, කුණු කසල ඉවත්කිරීම, ඩෙංගු මර්දනය, වරිපනම් බදු අය කිරීම්, යෝජනා ඉදිරිපත් කිරීම, විවාද කිරීම, මහජන උත්සවවල දී කටයුතු කිරීම හා Social Media භාවිතය පිළිබඳව ඉංග්‍රීසි භාෂාව හැසිරවීම මෙහි අරමුණ වේ. මෙම ඉංග්‍රීසි භාෂා වැඩසටහන ප්‍රාදේශීය සභා 15ක මේ වන විටත් ආරම්භ කොට ඇති අතර එහි සාර්ථකත්වය මත විවිධ ඉංග්‍රීසි භාෂා වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතයි.

උදා: ජංගම භාෂා විද්‍යාගාරය - එක් වර 30ට අධ්‍යාපනය ලැබිය හැකි වායු සමනය කළ ජංගම සුඛෝපභෝගී භාෂා විද්‍යාගාරය ප්‍රාදේශීය සභා මට්ටමින් ඉංග්‍රීසි දැනුම අපේක්ෂිත සිසු සිසුවියන් හා යෞවන යෞවනියන් වෙනුවෙන් ගම් දනව් කරා පැමිණෙනු ඇත. දින 10 ක කාලසීමාව තුළ මෙම භාෂා විද්‍යාගාරය තුළ සිට ඉංග්‍රීසි දැනුම මුවහත් කරගත හැකිවේ.

### 3. "ගමට දැනුම" අධ්‍යාපනික වැඩසටහන

නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය විසින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි පවතින ගැටලු හඳුනා ගැනීමෙන් ඒවා විසඳුම් ලබාදෙන ඒකක වෙත යොමුකිරීමත්, ප්‍රාදේශයේ වැඩිහිටි, කාන්තා, තරුණ ආදී සියලු ජනකොටස් ඒකාරාශි කොට පැවැත්වෙන මෙම බුද්ධි කළම්බන වැඩසටහන ප්‍රාදේශීය සභා ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ පාදක කොටගෙන එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට තුන බැගින් වූ ත්‍රි භාෂා ඉගෙනුම් මධ්‍යස්ථාන 900ක් පිහිටුවීම හා එක් බල ප්‍රදේශයකින් උගත් තරුණ තරුණියන් 2700 දෙනෙක් ඉංග්‍රීසි භාෂාව ඉගැන්විය හැකි ගුරුවරුන් ලෙස පුහුණුගත කොට රැකියාගත කිරීමේ ව්‍යාපෘතියක් ද අරඹා ඇත.

මෙවැනි එක් භාෂා මධ්‍යස්ථානයක් ප්‍රාදේශීය සභාවේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කෙරේ. මෙම මධ්‍යස්ථාන සඳහා භාෂා ගුරුවරුන් අනුයුක්ත කිරීම, පාඨමාලා සැකසීම විභාග පැවැත්වීම යන සහතික පත් ප්‍රදානය අප ආයතනය මගින් සිදු කෙරෙන අතර ප්‍රාදේශීය සභාව විසින් අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් හා ඊට අවශ්‍ය වෙනත් පසුතල පහසුකම් ලබාදිය යුතුවේ. මෙම හවුල්කාර ව්‍යාපෘතිය මේ වන විට ප්‍රාදේශීය සභා කිහිපයක මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වේ.

### 4. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි සියලුම පවුල් ඒකක ආවරණය වන පරිදි සිදු කෙරෙන සමාජ හා ආර්ථික සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පවුල් ඒකක සම්බන්ධව සමාජ හා ආර්ථික සමීක්ෂණ ගණනාවක් පසුගිය කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක විය.

කෙසේ වෙතත් ඒ ඒ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ ආවරණය වන පරිදි මෙතෙක් සමාජ හා ආර්ථික පරීක්ෂණයක් පවත්වා නොමැත. මෙම සමීක්ෂණය පැවැත්වීමට අදාළ සමීක්ෂණ ආකෘති පත්‍ර නිර්මාණය කිරීම, සමීක්ෂණ කණ්ඩායම් පුහුණු කිරීම, සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කොට අවසන් සාරාංශගත වාර්තාවක් සකස් කොට ලබාදීම නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය විසින් සිදු කෙරේ. ඒ ඒ ප්‍රාදේශීය සභාවන්ගේ ඉල්ලීම පාදක කොට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

**5. පළාත් පාලන ආයතනයෙහි කාර්ය මණ්ඩලය සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන පැවැත්වීම.**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට අනුව සෑම රාජ්‍ය නිලධාරියකුම භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුවේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020ට අනුව ඊට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව පළාත් පාලන ආයතනවල කාර්ය මණ්ඩලවලට පැය 100, 150, 200ක භාෂා පුහුණුවද අප ආයතනය විසින් සිදු කරමින් පවතී.

**6. කාර්ය මණ්ඩලය සඳහා විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලාභීන් සේ විශ්‍රාම වැටුප් ක්‍රමය, එහි ප්‍රතිලාභ වැන්දඹු අන්තදරු විශ්‍රාම වැටුප් හා එහි ප්‍රතිලාභ පිළිබඳව පවත්වන මෙම වැඩමුළුව හිටපු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙහෙයවනු ලැබේ.

**7. ප්‍රජා මණ්ඩල පිහිටුවීම හා එහි කාර්යභාරය පිළිබඳ එක් දින වැඩමුළුව**

ප්‍රජා සංවර්ධන නිලධාරීන් ප්‍රජා මණ්ඩල නිලධාරීන් වෙනුවෙන් පැවැත්වෙන වැඩමුළුවකි. ප්‍රජා සංවර්ධනය, ප්‍රජා නායකත්වය, ප්‍රජා සහභාගිත්වය, ප්‍රජා මණ්ඩල කාර්යභාරය මෙම වැඩමුළුවේදී පුළුල්ව සලකා බැලේ.

# 5. තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### තරුණ ව්‍යවසායකයා

අවස්ථාවක් උදාකරගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධාන නිර්මාණය කරගන්නා ව්‍යවසායකයෙකු වශයෙන් විලියම් ඩී. බයිග්‍රේව් හඳුන්වයි. ජෝසප් සුන්පීටර් විසින් ව්‍යවසායකයා අර්ථ ගන්වන්නේ පවත්නා ආර්ථික ක්‍රම වෙනස් කරමින්, නව අමුද්‍රව්‍ය සොයාගැනීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් නව භාණ්ඩ හෝ සේවා හඳුන්වාදෙන පුද්ගලයා වශයෙනි. එමෙන්ම මේරියම් වෙබ්ස්ටර් ශබ්දකෝෂය අර්ථ දක්වන්නේ ව්‍යාපාරයක අවදානම උපකල්පනය කරමින් එම ව්‍යාපාරය සංවිධානය කර කළමනාකරණය කරන තැනැත්තා ව්‍යවසායකයෙකු වශයෙනි.

### තරුණ ව්‍යාපාරිකයා සුවිශේෂී වේ. ඔහු,

■ වෙනත් අය නොදකින දේ දකින්නෙකි. ■ මුල පුරන්නෙකි. ■ වෙනස් කිරීම්වල නියෝජිතයෙකි. ■ ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම සිදුකරන්නෙකි. ■ අවදානම් දරන්නෙකි. ■ නිර්මාණශීලී පුද්ගලයෙකි. ■ හඳුනාගත් අවස්ථා ව්‍යාපාරික ආයතනයක් බවට පත් කරන්නෙකි. ■ ප්‍රායෝගික අදහස් තුළින් නව්‍යතා බිහි කරන්නෙකි. කෙටියෙන් කිවහොත් තරුණ ව්‍යවසායකයෝ සිහින මවන්නෝය. අවදානම් දරන්නෝය. ධෛර්ය සම්පන්නව එම සිහින සාර්ථක ව්‍යාපාර බවට පත් කරන්නෝ වෙති.

### ව්‍යවසායකත්වය

අවස්ථා උදාකරගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධානය නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වය වේ. එනම් නව දෙයක් සොයාගැනීම සහ නව්‍යතා සම්පාදනය ව්‍යවසායකත්වය ලෙස හැඳින්විය හැක. විලියම් ඩී. බයිග්‍රේව් දක්වන්නේ අවස්ථා උදාකරගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේදී සම්බන්ධ වන සියලු කටයුතු සහ ක්‍රියාකාරකම් ව්‍යවසායකත්වය වශයෙනි. එමෙන්ම ජෝෂප් ෂුම් පීටර් තවදුරටත් විශ්ලේෂණය කරන්නේ නව භාණ්ඩ හා සේවා හඳුනවාදීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් හෝ නව අමුද්‍රව්‍ය භාවිත කිරීමෙන් පවත්නා අර්ථ ක්‍රම වෙනස් කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වය වශයෙනි.

### තරුණ ව්‍යවසායකත්වයේදී

සම්මතයට පටහැනිව සිතමින් අලුත් යමක් පිළිබඳව සිහින මවමින් ඒවා යථාර්තයක් බවට පත්කිරීමට මූලාරම්භය සපයයි. මෙවැනි තරුණ ව්‍යවසායකත්වයේදී පැවැතිය යුතු ව්‍යවසායකත්ව නිපුණතාවයන් විශාල ප්‍රමාණයක් ඉන්දියාවේ ව්‍යවසායකත්ව සංවර්ධන ආයතනය (Entrepreneur Development Institute of India) පෙන්වාදේ.

■ ආරම්භන හැකියාව (Initiative) ■ අවස්ථා හඳුනාගැනීම සහ ක්‍රියාවට නැංවීම (Sees and Acts on Opportunities) ■ නොනැවතී කරගෙන යාම / අඛණ්ඩතාව (Persistence) ■ දැන සිටීම (Knowing) ■ වැඩෙහි ඉහළ ගුණාත්මක බව ගැන සැලකිලිමත් වීම (concern Quality of Work) ■ ගිවිසගෙන වැඩට කැපවීම (commiment to work contract) ■ කාර්යක්ෂම නැඹුරුව (Efficiency orientation) ■ විධිමත් සැලසුම්කරණය / ක්‍රමානුකූලව සැලසුම් කිරීම (Systematic planning) ■ ගැටලු විසඳීම (Problem solving) ■ බලපෑම් කිරීමේ හැකියාව (Assertiveness) ■ ආත්ම විශ්වාසය (Self Confidence) ■ ඒත්තු ගැන්වීමේ හැකියාව (Persuation) ■ බලපෑම් උපායන් භාවිතය (Use of Influence Strategies) ■ නියාමනය (Moanitioring) ■ සේවක සුභසාධනය ගැන සැලකිලිමත්වීම (concern for Enpolyee welfare)

## ව්‍යවසායකත්වයේ වැදගත්කම

■ වේගයෙන් වෙනස් වන ලෝකයේ නව වෙනස්කම්වලට මුහුණ දීමට හා නව්‍යතා සෙවීමට ව්‍යවසායකයන්ට හැකි වීම. ■ තරගකාරී ව්‍යාපාරික ලෝකය තුළ ව්‍යපාර අවස්ථා හඳුනාගැනීමටත් ඒවා ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට පත්කර ගැනීමටත් ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනිත කිරීමටත් ව්‍යවසායකයන්ට හැකිවීම. ■ වෙනස් වන ලෝකයට නායකත්වය දීමට ව්‍යවසායකයන්ට හැකිවීම. ■ පවතින සම්පත් භාවිතයට ගැනීම සඳහා ව්‍යාපාර විවිධාංගීකරණය කිරීමට හැකිවීම. ■ ගෝලීයකරණයතුළ නව තාක්ෂණය උපයෝගිකර ගනිමින් ව්‍යාපාර කටයුතු වෙනස් කිරීමට හැකිවීම.

මේ නිසා ගොවිපල, පාසල, විශ්වවිද්‍යාලය, ආරෝග්‍යශාලා, රජය, සමාජීය නියෝජිත ආයතන යනාදී සෑම ආයතනයකටම ව්‍යවසායකත්වය වැදගත් වේ.

## ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ

සෑම සාර්ථක ව්‍යවසායකුම ප්‍රතිලාභ ජනිත කරන්නේ ඔහුටම පමණක් නොවේ. ව්‍යවසායකයාගේ සාර්ථකත්වය නිසා පුද්ගල ප්‍රතිලාභ මෙන් ම සමාජ හා ආර්ථික ප්‍රතිලාභද අත් වේ.

## ව්‍යවසායකත්වයේ පුද්ගල ප්‍රතිලාභ

■ පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්ථා ලැබීම. ■ ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබාගත හැකි වේ. ■ පෞද්ගලික මූල්‍ය ප්‍රතිලාභ හිමි වේ. ■ සමාජීය වශයෙන් ප්‍රතිලාභ හිමි වීම. උදා: පිළිගැනීම,සමාජ තත්ත්වය, කීර්තිය / ප්‍රශංසා, සමාජ සම්බන්ධතා, නම්බුනාම. ■ ස්වයං තෘප්තිය. උදා: ආත්මාභිමානය, ස්වාධින බව, ධනයකට හිමිකම, සමාජයට සිදුවන දායකත්වය. ■ වෙනත් අය අනුගමනය කිරීම වෙනුවට නායකත්වය ගැනීමට හැකිවීම. ■ නිදහස් බව / තමාගේ ක්‍රියාපිළිවෙලකට වැඩ කිරීමේ නිදහස සලසා ගතහැකිවීම.

## ව්‍යවසායකත්වයේ සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ

■ තම රැකියා අවස්ථා උත්පාදනය වීම. ■ ආදායම් අවස්ථා බිහි වීම. ■ නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථාව උදා වීම. ■ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම. ■ පූර්ණ සේවා නියුක්තිය ඇති වීම. ■ ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම. ■ නව වෙළෙඳපොළවල් සංවර්ධනය. ■ නව තාක්ෂණය බිහිවීම. ■ ආර්ථික වෘද්ධිය /තිරසර ආර්ථික සංවර්ධනය.

## තරුණ කාන්තා ව්‍යවසායකත්වය

නව්‍යතා සම්පාදනය සඳහා (නව භාණ්ඩ හා සේවා උත්පාදනයට) කාන්තාවන් යොමු වීම මින් අදහස් වේ.

ශ්‍රී ලංකාවේ කාන්තාවන් ව්‍යවසායකයන් වශයෙන් පහත ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි කටයුතු කරයි.

■ මල් වගාව. ■ මනාලියන් හැඩගැන්වීම. ■ පෙර පාසල්. ■ දිවාසුරැකුම් මධ්‍යස්ථාන. ■ රූපලාවන්‍යය. ■ ඇඳුම් මැසීම. ■ කේක් ආකෘති සැකසීම. ■ මෝස්තර නිරූපණය. ■ විවිධ නිෂ්පාදන ව්‍යාපාර.

## කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය වීම තුළින් රටකට අත්වන ප්‍රතිලාභ

කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය වීමතුළින් රටකට ආර්ථික හා සමාජ ප්‍රතිලාභ රැසක් අත් වේ.

■ ජාතික ආදායම ඉහළ යාම. ■ රැකියා අවස්ථා බිහිවීම. ■ දේශීය සම්පත් භාවිතය. ■ විදේශ විනිමය ලැබීම. ■ කාන්තා ස්වාධීනත්වය වැඩි වීම. ■ පවුලේ ජීවන තත්ත්වය උසස් වීම.

### කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන අභියෝග

■ පුරුෂාධිපත්‍යය. ■ අවදානම් දැරීමට මැලි වීම. ■ ණය ගැනීමේ දී පරිස්සම් වීම. ■ සමාජීය වශයෙන් ඇති ආකල්ප පිටු දැකීමට දුෂ්කර වීම / එදිරිවාදි ආකල්ප. ■ සාම්ප්‍රදායික බවින් මිදීමට අකමැති වීම. ■ කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටන්වල හිඟකම. ■ කාන්තාවක් වශයෙන් සමාජයේ පිළිගැනීම. ■ ගේ දොර කටයුතු සඳහා වැඩි කාලයක් කැප කිරීම.

### තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය කඩිනම් කිරීම - අවශ්‍යතාවය

තරුණ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන ආයතන හා ප්‍රතිපත්ති රාමුවක් රට තුළ දක්නට ලැබේ. තරුණ කටයුතු අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, කුඩා ව්‍යාපාර ඒකකය, යොවුන් සේනාංකය, ක්‍රීඩා සංවර්ධන දොපර්තමේන්තුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, යෞවන සමාජ, ප්‍රජා මණ්ඩල ව්‍යාපාරය, කාන්තා කටයුතු අමාත්‍යාංශය ඒ අතර වැදගත් වේ. කෙසේ වෙතත් තරුණයාගේ මූලික අවශ්‍යතාවයක් වන රැකියා අවශ්‍යතාවයට තිරසර සංවර්ධන උපාය මාර්ග මේ දක්වා නිසි පරිදි ක්‍රියාත්මක වී ඇති බව නොපෙනේ. එබැවින් ඉතා කඩිනමින් යෞවන යෞවනියන් රැකියා ගත කිරීමේ උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය. ඊට පහත සඳහන් කරුණු ඇතුළත් කළ යුතුය.

■ ආර්ථිකයෙහි වැදගත් අංශය වූ තරුණ කොටස් ආර්ථික සංවර්ධනයට දායක කරගැනීම. ■ රට තුළ තරුණ කටයුතු ව්‍යාප්ත කිරීම. ■ රැකියා උත්පාදනය. ■ රට තුළ යෞවන ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකිරීම. ■ රටේ ඉතුරුම් තරුණයන් බලපැවැත්වීම සඳහා උපයෝගී කරගැනීම. ■ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම. ■ තරුණයා සමාජයේ වැදගත් ඒකකයක් බවට පත් කිරීම. ■ තරුණ වෘත්තීයභාවය ඇති කිරීම.

තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය වෙනුවෙන් සුළු පරිමාණ ව්‍යාපාර පිහිටුවීම හා එමගින් රැකියා සැපයීමට හා නිෂ්පාදනය නගාලීමට කෙසේ ක්‍රියා කළ හැකිද යන ප්‍රශ්නවලට පිළිතුරු ලෙස බංග්ලාදේශයේ ක්‍රියාත්මක වූ යෞවන ස්වයං රැකියා වැඩ පිළිවෙළ හඳුන්වාදිය හැක. 1982දී බංග්ලාදේශයේ යෞවනයන් අතර පැවති අධික රැකියා වියුක්තිය මගහැරීමට කම්කරු හා ජනශක්ති අමාත්‍යංශය මගින් එරට යෞවන සංවර්ධන දෙපාර්තමේන්තුවට බලය ලබා දෙන ලදී. මෙම යෞවන ස්වයං රැකියා වැඩ පිළිවෙළ ආරම්භ වූයේ 1982 අප්‍රේල් මාසයේ පිහිටුවන ලද ස්වයං රැකියා කිහිපයකිනි. එම ස්වයං රැකියා ව්‍යාපාර සාර්ථක ලෙස වර්ධනය වන බව ඒත්තු ගැන් වූවිට 1982 ජුනි මාසයේදී මෙම වැඩ පිළිවෙළ නිසියාකාරව ක්‍රියාත්මක කරන ලදී. 1983 දෙසැම්බර් මාසය වන විට 2000ක් යෞවනයන් ස්වයං රැකියාවල පිහිටුවන ලද අතර 1990 වන විට වසරකට 8000ක්දක්වා මෙම සංඛ්‍යාව වැඩිවිය. මෙම යෝධ ස්වයං රැකියා වැපිළිවෙළ යටතේ 1996 දක්වා 88596 දෙනෙකු ස්වයං රැකියාවන්හි පිහිටුවා ඇත. 1997/2002 පස් අවුරුදු සැලැස්ම අනුව එම පස්වසර තුළ දී තරුණ තරුණියන් 8,00,000ක් ස්වයං රැකියාවන්හි නිරත කරවීමට සැලසුම් කරන ලදී. ඉන් යෞවනයන් 5,50,000 වෙනුවෙන් ණය මුදල් සම්පාදනයටද පියවර ගැනුණි. (මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී බංග්ලාදේශයේ කම්කරු හා ජනශක්ති අමාත්‍යංශය උපදේශක වශයෙන් කටයුතු කර ඇත්තේ මාතර දිසාපතිවරයා වශයෙන් සේවය කළ ආචාර්ය ගාවින් කරුණාරත්න මහතාය.)

තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය කඩිනම් කිරීමේදී අවධාරණය කළ යුතු කරුණු කිහිපයක්ම සඳහන් කළ හැකිවේ.

### සුළු පරිමාණ ව්‍යාපාර කෙරෙහි අවධානය යොමුවීම

ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා වෙනත් ජාත්‍යන්තර ණය ආයතනවල ආයෝමය ග්‍රහණයෙන් මිදීමට ශ්‍රී ලංකාව වැනි රටවලට ඇති සාර්ථක උපාය මාර්ගයක් ලෙස සුළු පරිමාණ ව්‍යාපාර හැඳින්විය හැකි වේ. අප රටේ කුඩා (සුළු පරිමාන) ව්‍යාපාර හඳුනාගැනීමේදී නිර්ණායක කිහිපයක් වේ.

I. ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

"සේවක සංඛ්‍යාව 10කට අඩු ව්‍යාපාර වේ."

II. කාර්මික තාක්ෂණ ආයතනය
"ආයෝජන ප්‍රාග්ධනය රුපියල් මිලියන 4ක් නොඉක්මවන ව්‍යාපාර"

III. කාර්මික සංවර්ධන මණ්ඩලය
"ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 5කට වැඩි හා රුපියල් මිලියන 50ක් නොඉක්මවන ව්‍යාපාර"

IV. ශ්‍රී ලංකා මහ බැංකුව
"භාවිතා කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 500ට අඩු ව්‍යාපාර"

V. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
"ආයෝජන වටිනාකම රුපියල් මිලියන 100 නොඉක්මවන සහ අපනයන වටිනාකම රුපියල් මිලියන 150ට අඩු ව්‍යාපාර වේ."

කුඩා ව්‍යාපාර සඳහා දිරිගැන්වීම සපයන ආයතන ගණනාවක්ද මේ වන විට ස්ථාපිතව පවතී.

■ කාර්මික සංවර්ධන මණ්ඩලය. ■ කාර්මික තාක්ෂණ ආයතනය. ■ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය. ■ ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය. ■ ජාතික මෝස්තර මධ්‍යස්ථානය. ■ ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ, සංවර්ධන මධ්‍යස්ථානය.

## මූල්‍ය පහසුකම් සම්පාදනය

ශ්‍රී ලංකාව තුළ සුළු පරිමාන ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සපයන ආයතන ගණනාවක් දැකිය හැකිය.

■ ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව. ■ ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්. ■ සමෘද්ධි බැංකු. ■ ස්ටෙඩ් ආයතනය. ■ වානිජ බැංකු ඇතුළු මූල්‍ය ආයතන. ■ ජාතික සංවර්ධන බැංකුව. ■ ග්‍රාමීය සංවර්ධන බැංකුව.

ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය, කාර්මික සංවර්ධන මණ්ඩලය, කාර්මික තාක්ෂණ ආයතනය, වණික් බැංකු, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, මෙන්ම ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මණ්ඩලය යන ආයතන උපදේශක සේවා සපයන අතර ශ්‍රී ලංකේය තරුණ ව්‍යවසාය ආයතනය, සීමාසහිත ජාතික තරුණ සේවා සමුපකාරය, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ ආයතනය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, වානිජ මණ්ඩලය, එලදායිතා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා බුද්ධිමය දේපොල කාර්යාලය, නව නිපයුම්කරුවන්ගේ සංගමය, ජාතික ශිල්ප සභාව වැනි ආයතන ද විවිධ මට්මින් කුඩා ව්‍යාපාර හා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සහාය යනු ලැබේ.

## තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය හා සුළු පරිමාන ව්‍යාපාර බිහිකිරීමේදී අත්‍යවශ්‍ය සාධක

මෙවැනි සාධක ගණනාවක් පවතී.

■ සංවර්ධන සැලසුම් සම්පාදනය. ■ රජයේ පරිපාලනය ක්‍රමවත් හා නම්‍යශීලි කිරීම. ■ වෘත්තීය පුහුණුව ලබාදීම. ■ මූලික ආර්ථික පුහුණුව. ■ කාර්මික / තාක්ෂණ උපකාර හා සහයෝගය. ■ අවධිමත් අධ්‍යාපනය හා පුහුණුව.

බංග්ලාදේශයේ යෞවන ස්වයං රැකියා වැඩපිළිවෙළහි පරිපාලන චක්‍රලේඛ මගින් අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ මෙසේ සඳහන් කොට ඇත.

"පුහුණුවීමේ මධ්‍යස්ථානයෙහි කතිකාචාර්යවරු ව්‍යාපාරික යෞවනයන් එකතු කර සාමුහික වශයෙන් උපදෙස් ලබාදීම. ව්‍යාපාරවලින් ලත් පලපුරුද්ද හා සම්බන්ධකොට අවිධිමත් අධ්‍යාපන ක්‍රමයකින්, පසෙකින් සිට ඔවුනගේ චිත්ත ශක්තිය දියුණු විය හැකි පරිදි උපදෙස් දීමෙන් ඔවුන්ගේ තීක්ෂණ බුද්ධිය තීව්‍ර කළ යුතුය. මෙහි පරමාර්ථය වනුයේ යෞවනයන්ට ව්‍යාපාර සම්බන්ධ ප්‍රශ්න ස්වශක්තියෙන්ම නිරාකරණය කරගැනීමට අවකාශ සලසාදීමය. සමසක පමණ කාලසීමාවකදී මෙය අවිධිමත් අධ්‍යාපනික උපදෙස් නිසා නිදහස් වෙළෙඳ පොළෙහි වාතාවරණය ඇතුළත ව්‍යාපාරික ගැටලු නිරාකරණය කිරීමේලා ඇතිවූ තීක්ෂණ බුද්ධිය හා දැනුම අනුව ව්‍යාපාර සාර්ථක කර ගැනීමට හැකිවෙතැයි සිතේ."

''මෙහිදී ප්‍රජා සංවර්ධනය, සංකච්ඡා කිරීම හා සිතීමට හුරුකිරීම, නායකත්ව වර්ධනය, විඥාන ශක්තිය, සහයෝගිතාව හා ඒකමතික (සාමූහික) තීරණය කිරීමේ එවුන්ගේ ආත්ම විශ්වාසය වැඩිකිරීමටද හේතු වේ.''

■ පොදු සමුපකාර. ■ රට තුළ ක්‍රියාත්මක කළ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙළවල් යළි සමාලෝචනය කිරීම. ■ අත්‍යවශ්‍ය නොවන ආයතන සීමා කිරීම. ■ රට තුළ කාෂිකාර්මික සංවර්ධනය. ■ පශු සම්පත් අංශය සංවර්ධනය. ■ සුළු වාරිමාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම. ■ යෝග්‍ය තාක්ෂණයට ගැලපෙන කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. ■ රට තුළ පවතින ඛනිජ සම්පත් අපයෝජනයෙන් කර්මාන්ත බිහි කිරීම. ■ බලශක්තිය හා ජල විදුලිබලය වැඩිදියුණු කිරීම. ■ කාබනික පොහොර භාවිතය වැඩිකිරීම. ■ උසස් අධ්‍යාපනය මෙන්ම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනයට වැඩි අවධානය යොමු කිරීම.

**යෝජිත පස් අවුරුදු වැඩ පිළිවෙළ (2021 - 2025)**

1. තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන ඒකක ස්ථාපිත කිරීම / නීතිගත කිරීම.
2. ව්‍යවසායකත්ව සංවර්ධනය හා සුළු පරිමාන කර්මාන්ත සංවර්ධනය සඳහා පිහිටුවා ඇති ආයතන ඒකාබද්ධව කටයුතු කිරීම.
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් හඳුනාගැනීම, තෝරා ගැනීම.
4. විධිමත් / අවිධිමත් පුහුණු ක්‍රමවේදයක් සම්පාදනය.
5. වෘත්තීය / කාර්මික පුහුණුව ලබාදීම.
6. තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන ණය හා ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උදා:- පොලී රහිත ණය යෝජනා ක්‍රම.

ආපසු ණය ගෙවන කාල සීමාව දිර්ඝ කිරිම.

විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

7. 2025 වසර වන විට ව්‍යාපාර ඒකක 5,00,000ක් සංවර්ධනය කිරීම හා ණය ඒකක 4,00,000ක් ලබාදීම.

**යෞවනයන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙළ (2021 - 2025)**

| වර්ෂය | හඳුනාගනු ලබන තරුණ ව්‍යාපාරික ප්‍රජාව | පුහුණුව ලබාදෙන ප්‍රජාව | රැකියා ගත කිරීමේ ප්‍රමාණය | ආයෝජනය රුපියල් මිලියන |
|---|---|---|---|---|
| 2021 | 1,00,000 | 50,000 | 35,000 | 1,000 |
| 2022 | 1,00,000 | 50,000 | 70,000 | 2,000 |
| 2023 | 1,00,000 | 1,00,000 | 1,00,000 | 3,000 |
| 2024 | 1,00,000 | 1,00,000 | 1,00,000 | 3,000 |
| 2025 | 1,00,000 | 1,00,000 | 1,50,000 | 4,000 |

 රැකියාගත කිරීම සඳහා සුදුසු යෞවනයන් හඳුනාගැනීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පාදක කොටගෙන එය සිදු කිරීම යෝග්‍ය වේ. ඒ අනුව 2021 වර්ෂයේදී එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් 100 බැගින් ද 2022 වසරේදී 200 බැගින් ද 2023/24 වර්ෂවල දී 300 බැගින් ද 2025 වසරේදී 500 බැගින් තෝරාගෙන මෙම රැකියාගත කිරීම සිදු කළ යුතුය.

තරුණ ව්‍යවසායක සංවර්ධනය කඩිනම් කිරීමේදී මේ වන විටත් සුළු පරිමාණ ණය හා ආධාර මෙන්ම විවිධ තාක්ෂණික ආධාර සපයන ආයතන ඒකාබද්ධ කිරීමක් අත්‍යාවශ්‍ය වේ. එබැවින් මෙම සංකල්ප යෝජනාව අධ්‍යයනය කොට අමාත්‍ය මණ්ඩලය වෙත සුදුසු වාර්තාවක් සම්පාදනය කිරීම සඳහා විශේෂඥ කමිටුවක් ස්ථාපිත කිරීම වඩාත් වැදගත් වනු ඇත.

## 6 ගමට දැනුම

දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය තුළින් සෞභාග්‍යමත් දේශයක් 'ගමට දැනුම' වටසහන

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හා පැරණිතම රූපවාහිනී මාධ්‍ය ජාලය වන ස්වාධීන මාධ්‍ය ජාලය (Independent Television Network - ITN) හා ප්‍රමුඛතම අධ්‍යාපන ආයතනයක් වන නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය (Institute of Official Languages and Professional Studies - IOLPS) අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව සෞභාග්‍යමත් සමාජයක් උදෙසා දැනුම ආකල්පහා කුසලතා සංවර්ධනය වෙනුවෙන් ''ගමට දැනුම'' නම් වූ විශේෂ වැඩසටහනක් ආරම්භකොට ඇත.

02 2020 සැප්තැම්බර් 16 වන දින සිට 2021 සැප්තැම්බර් 15 දින දක්වා එනම්, වර්ෂයක කාලසීමාක් තුළ සති දෙකකට එක් වැඩසටහනක් බැගින් වැඩසටහන් 24ක් රට පුරා ක්‍රියාත්මක කිරීම ඉන් අපේක්ෂා කෙරේ. මෙම වැසඩටහන් ITN රූපවාහිනී නාලිකාව හා ලක්හඬ ගුවන් විදුලිය ඔස්සේ ප්‍රචාරය කෙරෙන අතර විශේෂයෙන්ම මෙම වැඩසටහන පැවැත්වෙන දිනයේදී අදාළ වැඩසටහන සම්බන්ධයෙන් තොරතුරු ITN රූපවාහිනී නාලිකාව හා වසන්තම් දෙමළ නාලිකාව ඔස්සේ හා පැයෙන් පැය පුවත් විකාශන හතරක් ඔස්සේ ප්‍රචාරය කෙරේ. ඊට අමතරව මෙම වැඩසටහනේ සජීවී තොරතුරු ලක්හඬ ගුවන් විදුලිය මගින් පෙරවරු 10.00 සිට පස්වරු 4.00 දක්වා විකාශනය කෙරෙන අතර සජීවී දුරකථන ඇමතුම් අවස්ථා තුනක් ද ලබාදෙනු ඇත. තවද මෙම වැඩසටහනට අදාළ තොරතුරු සහ ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් තොරතුරු ITN සහ IOLPS ආයතන විසින් පවත්වාගෙන යනු ලබන මුහුණු පොත් (Face Book) / YouTube යන සමාජ ජාලා ඔස්සේ ඇතුළත් කිරීම හා යාවත්කාලීන කරනු ලැබේ.

03 තරුණ තරුණියන් හා වැඩිහිටියන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය සඳහා විශේෂ වැඩමුළුවක් මෙම ''ගමට දැනුම'' වැඩසටහන යටතේ පවත්වනු ලබන අතර ප්‍රවීණ මානව සම්පත් සංවර්ධන උපදේශක හා නිල භාෂා හා වෘත්තීයඅධ්‍යයන ආයතනයේ සභාපති / ප්‍රධාන විධායක නිලධාරී චූලන් කුමාර රත්නායක මහතා විසින් මෙම වැඩමුළුව මෙහෙයවනු ඇත. මෙම වැඩමුළුව තුළින් දිවයිනේ තරුණ ව්‍යවසායක, සමාජ හා ප්‍රේෂක සමාජ බිහිකිරීම හා එම වැඩසටහන් ප්‍රචාරය කරමින් සමාජ දැනුම්වත් කිරිමටත් එමෙන්ම ස්වාධීන රූපවාහිනි මාධ්‍ය ජාලය ප්‍රවර්ධනය කිරීම හා මහජනතාවට එම මාධ්‍ය ජාලය සමීප කිරීමත් සිදුවනු ඇත.

04 ''ගමට දැනුම'' පළමු වැඩසටහන 2020 සැප්තැම්බර් 23 වන දින පොල්පිතිගම ප්‍රාදේශීය සභාව විසින් සංවිධානය කළ අතර එය අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. ඒ සඳහා 1500ක පමණ ජන සහභාගීත්වයක් ලැබුණි. වැඩසටහන පිළිබඳ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාරය ද ලබාදුන් අතර වැඩමුළුව අවසානයේදී එය මනා ඇගයුමකට ද ලක්විය.

05 දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධන වැඩමුළුව තුළින් මා පිය දූ දරු සබඳතා, දරුවන් හා දෙගුරුන් අතර සබඳතා, සිසු - ගුරු සබඳතා, පාරිභෝගිකයින් හා ව්‍යාපාරිකයින් අතර සබඳතා, සේව්‍ය - සේවක හෙවත් නිලධාරින් හා ආයතන ප්‍රධානීන් අතර සබඳතා ශක්තිමත් ලෙස ගොඩනැංවීමත් සහභාගිවන්නන් තුළ ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම හා හැසිරවීම පිළිබඳ යහපත් ආකල්ප තවදුරටත් වර්ධනය කිරීමටද මෙය පිටුවහලක් වේ. පොල්පිතිගම ප්‍රාදේශීය සභාව සමඟ සාර්ථකව කරන ලද වැඩසටහන තුළින් ලද ආදර්ශය සැලකිල්ලට ගෙන තවත් පළාත් පාලන ආයතන කිහිපයක මෙම ''ගමට දැනුම'' වැඩසටහන දියත් කිරීමට නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය අපේක්ෂා කරන අතර ඒ සඳහා ඔබ ආයතනයට අප හා එක්වී ''ගමට දැනුම'' වැඩසටහනක් සංවිධානය කරන ලෙස ගෞරවයෙන් ඇයුම් කරමි. මෙම වැඩසටහන සම්බන්ධයෙන් ඒ ඒ ආයතනයන් හි කාර්යභාය පහතින් දැක්වේ.

### නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනයේ කාර්යභාරය

- පාසල් දරුවන්ගේ, යෞවන යෞවනියන්ගේ හා වැඩිහිටියන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීමේ දේශන හා වැඩසටහන් මාලා පැවැත්වීම.
- සති දෙකකට වරක් ''ගමට දැනුම'' වැඩසටහනක් සංවිධානය කිරීම.
- වැඩසටහන පවත්වන ස්ථානය හා අදාළ පිරිස තෝරාගැනීම.
- මෙම වැඩසටහන සඳහා ඉදිරිපත් වන එක් එක් ප්‍රදේශයේ ජනතාවගේ තොරතුරු ලබාගැනීමට අවශ්‍ය අයදුම්පත්‍ර සකස් කිරීම සහභාගීවන්නන් ලියාපදිංචි කිරීම.
- වැඩසටහන පැවැත්වෙන දිනවල අදාළ කාර්ය මණ්ඩලයට ආහාරපාන හා නවාතැන් පහසුකම් හා අධිවේගී මාර්ග වියදම් යනාදිය හැදෑරීම.

### ස්වාධීන රූපවාහිනී මාධ්‍යජාලයේ කාර්යභාරය

- මෙම වැඩසටහන පවත්වන දිනය පිළිබඳ පූර්ණ ප්‍රචාරක පටයක් නිර්මාණයකොට (සතියකට පමණ පෙර සිට) දිනකට කිහිපවරක් රූපවාහිනී මාධ්‍යජාලයේ පැයෙන් පැයට පුවත් තුළින් හා ලක්හඬ ගුවන් විදුලිය ඔස්සේ ප්‍රචාරයක් ලබාදීම හා ප්‍රාදේශීය මාධ්‍යකරුවන් සහභාගි කරවීම.

06 පොල්පිතිගම ආදර්ශයට අනුව ඉතා ආකර්ෂණීය වැඩසටහනක් වූ ''ගමට දැනුම'' තවදුරටත් පළාත් පාලන ආයතනය මුලිකකොට පැවැත්විමට අප ආයතනය අපේක්ෂා කෙරේ. ඒ අනුව පළාත් පාලන ආයතනයන්හි කාර්යභාරය පහත දැක්වේ.

- වැඩසටහන පැවැත්වීමට සුදුසු ස්ථානයක් තෝරාගැනීම (1000ක පමණ පිරිසක් අසුන්ගත කිරීමට හැකි ප්‍රාදේශීය සභා හෝ පාසල් ශ්‍රවණාගාරයක් සුදුසුය.)
- වැඩසටහන සඳහා මහජන නියෝජිතයන්, යෞවන යෞවනියන්, වැඩිහිටියන්, පෙර පාසල් ගුරුවරියන් හා දෙමව්පියන්, ප්‍රජා මණ්ඩල සහ වෙනත් සංවිධාන ක්‍රියාකාරින් සහභාගි කරාගැනීම.
- සහභාගි වන පිරිසට දිවා ආහාර හා අනෙකුත් සංග්‍රහ කටයුතු සම්පාදනය කිරීම.

07 ''ගමට දැනුම'' වැඩමුළුවක් පැවැත්වීම තුළින් පළාත් පාලන ආයතනයන්හි කාර්ය සාධනය වැඩිදියුණු කිරීමට මහඟු අවස්ථාවක් උදාවන බව නොඅනුමානය. එබැවින් නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය හා ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ හැකිය.

# 7. වෘත්තීය අධ්‍යාපන වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ වෘත්තීය අධ්‍යාපන ආයතනයක් වශයෙන් ලියාපදිංචි වී සිටීමත්, ලියාපදිංචි වී සාර්ථකව කටයුතු කිරීම හේතුවෙන් නිපුනතා සංවර්ධන අමාත්‍යංශය මගින් ක්‍රියාත්මක කරන නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විවිධ පුහුණු වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් සිටී. මෙම වැඩසටහන යටතේ අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පූර්ණ ශිෂ්‍යත්ව හිමිවන අතර පාඨමාලාවෙන් පසු රැකියාගත කිරීම ද සිදු කෙරේ. වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතින් අතර මිනින්දෝරු ක්ෂේත්‍ර සහකාර පාඨමාලාව, සංචාරක හෝටල් ඉදිරිපෙළ පිළිගැනීම් මෙහෙයුම්, සංචාරක මෙහෙයුම් සංවිධානය යන පාඨමාලාවන් ක්‍රියාත්මක වේ.

2020 වසරේදී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විශිෂ්ඨයන් සඳහා පිරිනැමෙන තත්ත්ව සම්මාන සහතිකයෙන් ද (QMS) නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය පිදුම් ලබා ඇත.

## IOLPS ඉදිරි වැඩසටහන්

2021 - 2025 වසර 05ක කාලසීමාව තුළ මෙම ආයතනය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් පහත දැක්වේ.

- ත්‍රි භාෂා ඉගෙනුම් මධ්‍යස්ථාන තව දුරටත් ශක්තිමත් කිරීමට එනම් ICT හා වෙනත් විදේශ භාෂා ඉගැන්වීමට අවධානය යොමු කිරීම.
- ශ්‍රී ලංකා භාෂා පදනම පිහිටුවීම.
- දෙමළ භාෂාව ඉගැන්වීම පිළිබඳව ගුරුභවතුන් 2000ක් පුහුණු කිරීම.
- දෙමළ භාෂාව කථාකරන ප්‍රදේශ සඳහා සිංහල භාෂාව ඉගැන්විය හැකි ගුරුභවතුන් 200ක් පුහුණු කිරීම.
- ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමා ලාභීන්හට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අධ්‍යයනවේදි උපාධිය ලබාදීමට අවශ්‍ය පහසුකම් සලසා දීම.
- රාජ්‍ය සේවය තුළ දෙමළ භාෂාව ප්‍රචලිත කිරීම සඳහා උපාය මාර්ගික සැලස්මක් සම්පාදනය.
- නිල භාෂාවන් හා සන්ධනා භාෂාව ජනප්‍රිය කරවීම සඳහා තරගාවලියක් පැවැත්වීම.
- 'IOLPS Aword' හඳුන්වාදීම.
- රජය හා පෞද්ගලික අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා පාඨමාලා හා වැඩමුළු සංවිධානය කිරීම.
- සුළු පරිමාන ව්‍යාපාර බලගැන්වීම හා ඒකාබද්ධ සංවිධානයක් ස්ථාපිත කිරීම.
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශන සමාජයට දායක කිරීම.

ආකෘති / படிவம் / FORM — 2 අ / 2 அ / 2A

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

සමාගමේ අංකය / கம்பனி இலக்கம் / No. of Company: පී වී / P V / பீ வீ — 121553

2007 අංක 7 දරණ සමාගම් පනත
2007 ஆம் ஆண்டின் 7 ஆம் இலக்கக் கம்பனிகள் சட்டம்
The Companies Act, No. 7 of 2007

පෞද්ගලික සමාගම
தனியார் கம்பனி
PRIVATE COMPANY

# සංස්ථාගත කිරීමේ සහතිකය
# கூட்டிணைப்புச் சான்றிதழ்
# CERTIFICATE OF INCORPORATION

(5 වන වගන්තිය අනුව)
(பிரிவு 5 இன் பிரகாரம்)
(Pursuant to Section 5)

ඉන්ස්ටිටියුට් ඔෆ් ඔෆිෂියල් ලැන්ග්වේජස් ඇන්ඩ් ප්‍රොෆෙෂනල් ස්ටඩීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

…………………………………………########

2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ අවශ්‍යතා සපුරා ඇති බැවින් පෞද්ගලික සමාගමක් වශයෙන් අද දින සංස්ථාගත කළ බවත්, එකී සමාගම සීමාසහිත බවත් මම මෙයින් සහතික කරමි.

දෙදහස් දාහත ක් වූ අප්‍රේල් මස හත් වන මෙදින කොළඹ දී අත්සන්කොට දුනිමි.

இன்ஸ்டிடியுட் ஒப் ஒபீசியல் லெங்வேஜஸ் எண்ட் புரபசெனல் ஸ்டடீஸ் (பிறைவட்) லிமிடட்

2007 ஆம் ஆண்டின் 7 ஆம் இலக்க கம்பனிகள் சட்டத்தின் கீழான எல்லாத் தேவைப்பாடுகளும் இணங்கியொழுகப்பட்டு இத் திகதியன்று தனியார் கம்பனியாக கூட்டிணைக்கப்பட்டுள்ளது என்றும் அக்கம்பனி வரையறுக்கப்பட்டதென்றும் நான் இத்தால் சான்றளிக்கின்றேன்.

இரண்டாயிரத்து பதினேழு ஆம் ஆண்டு ஏப்ரல் மாதம் ஏழாம் திகதியன்று கொழும்பில் என்னால் கைச்சாத்திட்டுக் கொடுக்கப்பட்டது.

I hereby certify that INSTITUTE OF OFFICIAL LANGUAGES AND PROFESSIONAL STUDIES (PRIVATE) LIMITED is this day incorporated as a Private Company having complied with the requirements under the Companies Act, No. 7 of 2007 and that the Company is limited.

Given under my hand at Colombo, this Seventh day of April Two Thousand Seventeen

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
கம்பனிகள் - பதிவாளர் நாயகம்
Registrar-General of Companies

සටහන: 1. මෙම සහතිකය පෞද්ගලික සමාගමක් සඳහා වේ. - 5(2) වගන්තිය සමග කියවෙන 3 වන වගන්තිය
2. II කොටසෙහි ප්‍රතිපාදනයන් අදාළ වේ - 3(2) වගන්තිය

குறிப்பு : 1. இந்த சான்றிதழ் தனியார் கம்பனிக்குரியது பிரிவு 3 ஐ பிரிவு 5 (2) உடன் சேர்த்து வாசிக்கவும்.
2. சட்டத்தின் பாகம் II என்பதன் ஏற்பாடுகள் ஏற்புடையனவாகும். -பிரிவு 3 (2)

NOTE: 1. This certificate is for a Private Company - Section 3 read with Section 5(2)
2. The Provisions of Part II apply - Sec. 3(2)

TVEC QMS

TVEC

# Quality Management System Certificate of Conformity

The Tertiary and Vocational Education Commission (TVEC)
certifies that the Quality Management System (QMS) of
**Institute of Official Languages and Professional Studies(Pvt) Ltd**
**No. 275, Main Street,**
**Battaramulla.**
has been audited and approved in accordance with
the requirements of QMS stipulated by the TVEC ,

Certificate No : 2020/SEP/05 Registration No : P01/0804

Certificate issued on : 2020/09/25 Valid up to : 2023/09/24

Date of first certification : 2020/09/25

## SCOPE OF CERTIFICATION

To conduct NVQ courses covering core processes viz; academic staff affairs, training equipment maintenance/material purchase, environment/infrastructure maintenance, updated NCS & curricula/training documents, final & continuous assessments, training delivery, student enrolment, customer satisfaction and financial stability/affairs.

This approval is subject to the continued satisfactory operation of the Quality Management System in the organization

TVEC QMS

Director General

TVEC Quality Management System Standards for Technical and Vocational Education and Training are developed under the mandate of the Tertiary and Vocational Education (Amendment) Act No 50 of 1999.

**Tertiary and Vocational Education Commission**

Nipunatha Piyasa, 354/2, Elvitigala Mawatha, Colombo 05, Sri Lanka.

www.tvec.gov.lk

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
மூன்றாம் நிலைக்கல்வி, தொழிற்கல்வி ஆணைக்குழு
TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, வேலைவாய்ப்பு மற்றும் தொழில் உறவுகள் அமைச்சு
Ministry of Skills Development, Employment & Labour Relations

දිනය / திகதி / Date: **07/Oct/2020** මගේ අංකය / எனது எண் / My No.: **III/05/07/01** ඔබේ අංකය / உமது எண் / Your No.: **A06380**

Director/CEO
Institute of Official Languages and Professional Studies (Pvt) Ltd
275
Main Street
Battaramulla.

Renewal Registration of Training Institute

We are pleased to inform you that in accordance with the provisions of the Tertiary and Vocational Education Act No. 20 of 1990 and the Development Plan published in the extraordinary gazette notification No. 887/8 dated 7th September 1995, the Tertiary and Vocational Education Commission has approved the registration of your training institute, and it is valid up to 24/Sep/2022.

| | | |
|---|---|---|
| Name of the Training Institute | : | Institute of Official Languages and Professional Studies (Pvt) Ltd |
| Address | : | 275<br>Main Street<br>Battaramulla. |
| Registered No. | : | P01/0804 |
| Date of Initial Registration | : | 10/Sep/2018 |

The registration covers the following course(s):

1. Diploma in English Language Teaching

---

Total no. of Courses 1

J.A.D.J. Jayalath
Director General

354/2, 03 වන මහල, "නිපුණතා පියස", ඇල්විටිගල මාවත, කොළඹ 05. 354/2, 03 ஆம் மாடி, "நிபுணதா பியச", எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05.
354/2, 3rd Floor, "Nipunatha Piyasa" Elvitigala Mawatha, Colombo 05, Sri Lanka.
දුරකථන / தொலைபேசி / Telephone 011-7608000 ෆැක්ස් / தொலைநகல் / Fax 011-2555007 වෙබ් අඩවිය / இணைய தளம் / Web Site www.tvec.gov.lk විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail info@tvec.gov.lk
"ජාතික වෘත්තීය සුදුසුකම් මගින් පිළිගත් වෘත්තීය නිපුණතාවන්" "NVQ ஊடாக ஏற்றுக்கொள்ளப்பட்ட வாழ்க்கைத் தொழில் தேர்ச்சிகள்" "Certified Vocational Competencies through NVQ"

TERTIARY AND VOCATIONAL EDUCATION COMMISSION

TVEC

# Course Accreditation Certificate

*This is to certify that*

*the course on* **Teaching English as a Second Language** *conducted by*

**Institute of Official Languages and Professional Studies (Pvt) Ltd**

*at* 275, Main Street, Battaramulla.,

*(TVEC registration No.* P01/0804*)*

*has been accredited and that the course fulfils the requirements of*

*National Competency Standards*

*for* Teaching English as a Second Language

*(NCS code* M80T003.0*)*

*leading to*

## *National Vocational Qualification (NVQ)*

*This certificate is awarded under the provisions of Tertiary and Vocational Education (TVE) Act No. 20 of 1990 and the TVE Act (Amendment) No. 50 of 1999.*

*Qualifications awarded in the course:*

| *Qualification Package* | *Units* |
|---|---|
| M80T003Q1L5.0 | NVQ Level 5 - Units (EMTU01+EMTU02+EMTU03+01+02+03+04+05+06 +07+08+09+10) |

*This certificate is valid for a period of* Three(3) *years from the date of award.*

Date of award : 01/Oct/2020

e- Certificate No. : M80T003-0

Director General
Tertiary and Vocational Education Commission

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
**National Institute of Language Education and Training**
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளுராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils, and Local Government**

321/1, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
321/1, High Level Road, Makumbura, Pannipitiya
321.்.1இ ஹைலெவல் வீதிஇ மாகும்புரஇ பன்னிபிட்டிய

පුහුණු ආයතනය - ගලේවත්ත අගලවත්ත
දුරකථන අංක - 034-3944352

Training Centre – Galewatta,Agalawatta
Telephone – 034-3944352

මගේ අංකය
எனது இல
My No NILET/PL/2018/RE/IN

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date 2020.02.27

Chairman,
Institute of Official Languages and Professional Studies,
No:275,
Main Street,
Baththaramulla.

**<u>Registration as a Franchise Institution</u>**

I am pleased to inform you that your institution has been registered as a franchise for training programs conducted by National Institute of Language Education and training (NILET) from today onwards.

***Your Registration Number – NILET/FRI/018***

Accordingly, your institution has to comply with the agreement signed between NILET and you regarding this matter. Moreover, Training course, which are recommended by NILET should be conducted by your Institution according to the instruction mentioned in annexure 01.

I do immensely appreciate your cooperation on implementing official languages policy.

Jayampathi Bandara Heenkenda
Chairman

Jayampathi Bandara Heenkenda
Chairman
National Institute of Language Education and Training
No. 321/1, Makumbura, Pannipitiya.

දුරකථන தொலைபேசி Telephones :

සභාපති
துலைவர்
Chairman
011-2172603

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் நாயகம்
Director General
0112-086420

පොදු
பொது
Common
011-3092910
011-2172759
011-2172674

ෆැක්ස්
தொலைநகல்
Fax

ෆැක්ස්
தொலைநகல்
Fax
0112-086420

011-2086422

ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
**National Institute of Language Education and Training**
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள்,,மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government
321/1, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
321/1, High Level Road, Makumbura, Pannipitiya
321/1, ஹைலெவல் வீதி, மாகும்புர, பன்னிபிட்டிய

Web: www.nilet.gov.lk
පුහුණු ආයතනය - ගලේවත්ත අගලවත්ත
දුරකථන අංක - 0343944352

E mail: nilet@sltnet.lk
Training Centre – Galewatta,Agalawatta
Telephone - 0343944352

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | ඔබේ අංකය<br>உமது இல“<br>Your No | දිනය<br>திகதி<br>Date 2020/03/02 |

Chairman/ CEO

Institute of Official languages & Professional studies

275, Main Street,

Battaramulla.

**Requesting for approval to start the following Courses**

This is with reference to your letter dated on 27th February 2020 numbered IOLPS/NILET/001.

As per the conditions and instructions given to you by the institution. I approve your programmes that you have arranged so far.

Please be kind enough to follow the guideline and organize all your programmes accordingly.

I do appreciate your commitment for promoting trilingualism in our country.

Sincerely,

Prasath R Herath
Director General (NILET)

Prasath R Herath
Director General
National Institute of Language Education & Training
No. 321/1,
Makumbura, Pannipitiya

දුරකථන தொலைபேசி Telephones :

| | | | | | |
|---|---|---|---|---|---|
| සභාපති<br>தலைவர்<br>Chairman | 011-2171603 | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 0112-086420 | පොදු<br>பொது<br>Common | 011-3092910<br>011-2172759<br>011-2172674 |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 0112-086420 | | 011-2086422 |

IOLPS Institute of Official Languages and Professional Studies
We Create Job Providers Not Job Seekers

# ත්‍රි භාෂා පුහුණු මධ්‍යස්ථාන

**භාෂා ප්‍රවීණතාවය අනාගතය ජයගත හැකි හොඳම මාවතයි**



- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට මධ්‍යස්ථාන තුනක් බැගින් පිහිටුවීම
- භාෂා ගුරුවරුන් 3000ක් රටට බිහිකිරීම
- සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පුහුණු මධ්‍යස්ථාන 900ක් පිහිටුවීමේ අභියෝගයට දායක වෙමු

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය**

නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk

IOLPS Institute of Official Languages and Professional Studies
We Create Job Providers Not Job Seekers

# "කඩුව මුවහත් කරමු"

**ඉංග්‍රීසි දැනුමෙන් ලොව ජයගනිමු**



ඉංග්‍රීසි දැනුම


- **ICE** - INTENSIVE COURSE FOR ENGLISH - නේවාසික
- **ICE** - INTENSIVE COURSE FOR ENGLISH - නේවාසික නොවන
- **DELT** - DIPLOMA IN ENGLISH LANGUAGE TEACHING
- **ADELT** - ADVANCED DIPLOMA IN ENGLISH LANGUAGE TEACHING
- **B.Ed** - English උපාධියට වරම්
- භාෂා පුහුණු කඳවුරු
- නිසැකවම ඉංග්‍රීසි ජයගැනීමේ මාවත

බැංකු ණය පහසුකම් ලබාගැනීම හා වැඩිදුර තොරතුරු සඳහා
071 9 130 110
071 7 000 460
011 5 110 110

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය**

නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk


පොදු බස මෙන් දෙමළ බස
IOLPS Institute of Official Languages and Professional Studies
We Create Job Providers Not Job Seekers
දෙමළ භාෂා පුහුණු පාඨමාලා
ආයුබෝවන්! வணக்கம்
(වණක්කම්)
සුබ උදෑසනක් වේවා!
இனிய காலை வணக்கம்
(ඉනිය කාලෙෙ වණක්කම්)
සුබ සන්ධ්‍යාවක් වේවා!
இனிய மாலை வணக்கம்
(ඉනිය මාලෙෙ වණක්කම්)
නැවත හමුවෙමු!
மீண்டும் சந்திப்போம்
(මීණ්ඩුම් සන්දිප්පෝම්)
දෙමළ බසෙහි මිහිර විඳිමු
නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය
නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk


IOLPS Institute of Official Languages and Professional Studies
We Create Job Providers Not Job Seekers
ITN
ශ්‍රී ලංකා ஸ்ரீ லங்கா
Education
Information
Solution
Experience
Analysis
Learning
Knowledge
ගමට දැනුම
දහඩිය සුවඳෙහි අගය දැනෙන්නේ
දිවිමග තෙරපෙන ගැටලු සොයන්නේ
විසඳුම් සොයනා මගක් තනන්නේ
ගමට දැනුම අපි ඔබට ගෙනෙන්නේ
නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය
සමග ස්වාධීන රූපවාහිනී සේවය
නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල 0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk

IOLPS
We Create Job Providers Not Job Seekers
Institute of Official Languages and Professional Studies

මහජන සේවයට කැපවුණු ඔබ වෙනුවෙන්

# ඉංග්‍රීසි භාෂා පුහුණුව



## ඉංග්‍රීසියෙන් හිතමු. ඉංග්‍රීසියෙන් වැඩ කරමු

- පළාත් පාලන ආයතනය විසින් සපයනු ලබන සේවා පහසුකම් උදාහරණ - කුණු කසල ඉවත් කිරීම, ඩෙංගු රෝග මර්දනය, වරිපනම් බදු අය කිරීම ආදී කටයුතු
- මාසික මහා සභාවට යෝජනා ඉදිරිපත් කිරීම, යෝජනා පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, විවාද කිරීම හා ස්ථිර කිරීම පිළිබඳව කරුණු දැක්වීම
- උත්සවවලදී පිළිගැනීම, අදහස් ප්‍රකාශ කිරීම හා ස්තූති කිරීම
- ලිපි සකස් කිරීම හා පිළිතුරු ලිපි යැවීම
- බැංකු, වීසා, විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීම
- සමාජ මාධ්‍ය Social Media භාවිතය Facebook, imo, WhatApp, Viber, Twitter මනාව හැසිරවීම
- සන්නිවේදන කුසලතා (Commuication Skills) වර්ධනය

මහ නගර සභා නගර සභා හා ප්‍රාදේශීය සභා
මහජන නියෝජිතයන් වෙනුවෙන් සම්පාදිත එකම
**ඉංග්‍රීසි පාඨමාලාව**

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය**

නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk

IOLPS
We Create Job Providers Not Job Seekers
Institute of Official Languages and Professional Studies

මහජන සේවයට කැපවුණු ඔබ වෙනුවෙන්

# ඉංග්‍රීසි භාෂා පුහුණුව



## අපි ඉංග්‍රීසියෙන් වැඩ කරමු

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ වගකීම
- MOH බලප්‍රදේශය තුළ සපයනු ලබන සේවා පහසුකම්, උදාහරණ - කුඩා දරුවන්ගේ ආරක්ෂාවද එන්නත් කිරීම, රෝග මර්දනය
- යෝජනා ඉදිරිපත් කිරීම, කරුණු දැක්වීම හා අදහස් ප්‍රකාශ කිරීම
- ඉදිරිපත් කිරීම් (Presentation)
- සෞඛ්‍ය වැඩසටහන්වලදී පිළිගැනීම, අදහස් ප්‍රකාශ කිරීම හා ස්තූති කිරීම
- ලිපි සකස් කිරීම හා පිළිතුරු ලිපි යැවීම
- සමාජ මාධ්‍ය මනාව හැසිරවීම
- සන්නිවේදන කුසලතා වර්ධනය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්
වෙනුවෙන් සම්පාදිත එකම
**ඉංග්‍රීසි පාඨමාලාව**

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය**

නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk

IOLPS Institute of Official Languages and Professional Studies
We Create Job Providers Not Job Seekers

# අභියෝග ජය ගනිමු
# ඉංග්‍රීසි භාෂා පුහුණු කඳවුර

සැම නිවසකම ඉංග්‍රීසි කථා කරන දරුවෙක්



- ඉංග්‍රීසි භාෂාව මනාව හැසිරවීම නිසැකවම ලබාදෙන දින 30ක නේවාසික වැඩමුළුව
- ඉංග්‍රීසි භාෂාව සවන්දීම, කථාකිරීම, ලිවීම, කියවීම, අවබෝධ කරගැනීම පිළිබඳ සාපිපාසාවෙන් පෙළෙන ඔබ වෙනුවෙන්මය.
- ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම වෙන වෙනම පුහුණු කඳවුරු
- බත්තරමුල්ල හා එප්පාවල මධ්‍යස්ථානයන්හි කඳවුරු පැවැත්වේ.

**නිල භාෂා හා වෘත්තීය අධ්‍යයන ආයතනය**

නො. 275, ප්‍රධාන වීදිය, බත්තරමුල්ල
0115 110 110 iolpscampus@gmail.com www.iolps.lk